අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

2020

වාර්ෂික වාර්තාව
ஆண்டறிக்கை
Annual Report

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
State Printing Corporation

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
அரசாங்க அச்சகக் கூட்டுத்தாபனம்
STATE PRINTING CORPORATION

වාර්ෂික වාර්තාව,
ගිණුම් ප්‍රකාශන
සහ
විගණකාධිපතිගේ වාර්තාව

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2020

වාර්ෂික වාර්තාව

2020 දෙසැම්බර් මස 31 වෙනි දින දක්වා

2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ 53 වෙනි වසර සඳහා

2020 ජනවාරි මස 01 වෙනි දින සිට

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

දැක්ම

මුද්‍රණයේ විශිෂ්ටත්වය තුළින්
අපගේ පාරිභෝගිකයන්ගේ හා පාර්ශ්වකරුවන්ගේ
චින්තනයේ සහ නේරීම තුළ
ප්‍රමුඛයා බවට පත්වීම.

මෙහෙවර

උගත් සහ මනා කැපවීමක් සහිත
ශ්‍රම බලකායක් සමඟ අති නවීන තාක්ෂණය,
තත්ත්ව කළමනාකරණ,
පරිසරය හා බලශක්ති කළමනාකරණ පද්ධතීන් තුළින්
කාර්යක්ෂම, වේලාසූචී සහ නිරසාර
මුද්‍රණ සංවර්ධනයක් උදෙසා කැපවෙමු.

පානළුව,
පාදුක්ක.

ගරු අධ්‍යාපන අමාත්‍යතුමා
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල.

ගරු ඇමතිතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වෙනි වගන්තියේ කොන්දේසිවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය ආවරණය කෙරෙන,

01. රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ කටයුතු පිළිබඳ වාර්ෂික වාර්තාව
02. ගණන් පරීක්ෂණයට භාජනය කරන ලද මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය හා විස්තීරණ ආදායම් ප්‍රකාශය ඇතුළු මූල්‍ය ප්‍රකාශන
03. විගණකාධිපතිවරයාගේ අදහස් දැක්වීම

ඔබතුමාගේ දැන ගැනීම සඳහා මේ සමග ඉදිරිපත් කරමි.

මෙයට - විශ්වාසී

ජේ. එම්. යූ. බී. ජයසේකර
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව



සභාපතිතුමාගේ පණිවිඩය

1968. 09. 04 වැනි දා ඇරඹී රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව මේ වන විට තම 54 වන ජයග්‍රාහී කඩඉම පසුකර ඇති මොහොතක එහි අභිනව සභාපතිවරයා ලෙස පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ජීවිතයේ ලද භාග්‍යයක් සේ සලකමි.

පාසල් පෙළපොත් දැයේ දුවා දරුවන් වෙත ලබාදීමේ අරමුණ පෙරදැරිව 1968 අංක 24 දරන පනතින් ආරම්භ කළ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පෙළපොත්වලට අමතරව SPC වෙළඳ නාමය යටතේ අභ්‍යාස පොත් ද මුද්‍රණය කර ලබා දීමට කටයුතු කරයි.

එවකට අධ්‍යාපන අමාත්‍ය, වර්තමාන අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගේ ඉල්ලීම පරිදි මා 2022 පෙබරවාරි 19 දින මෙම සංස්ථාවේ සභාපති ධුරය භාර ගන්නා ලදී.

අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාලනය වන රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව, පසුගිය කාලයේ රටේ පැවති දේශපාලන අවිනිශ්චිතතාව හා ආර්ථික අර්බුදය හමුවේ අභියෝගාත්මක ගැටලු රැසකට මැදිවූ අතර, ඉන් ප්‍රධාන අභියෝගය වූයේ රටේ පැවති ඩොලර් අර්බුදය හමුවේ 45%ක් වූ පාසල් පෙළපොත් මුද්‍රණය හා අභ්‍යාස පොත් ඇතුළු අනෙකුත් මුද්‍රණ කටයුතු සඳහා අවශ්‍ය කඩදාසි මිලදී ගැනීමට නොහැකි වීමයි. එනමුත් අතිගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ අධ්‍යාපන අමාත්‍ය, ආචාර්ය ගරු සුසිල් ප්‍රේමජයන්ත් මැතිතුමාගෙන් කළ ඉල්ලීම පරිදි ඉන්දීය ණය යෝජනා ක්‍රමය හරහා කඩදාසි ලබා ගැනීමේ වැඩපිළිවෙළ මේවන විට සාර්ථක ලෙස ක්‍රියාවට නැංවී ඇති අතර, මේ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් එම්. එන්. රණසිංහ මහතාද දරන ලද්දේ ඉමහත් කැප කිරීමකි. පාසල් පෙළපොත් මුද්‍රණය සඳහා ඉන්දීය ණය යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 20ක් හා අභ්‍යාස පොත් මුද්‍රණය සඳහා එකී යෝජනා ක්‍රමය යටතේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1.5ක් වෙන් කර ගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලද අතර එය මා ලද ජයග්‍රහණයක් සේ සලකමි. පෙළපොත් මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය කඩදාසි මෙට්‍රික් ටොන් 8791 ද, මුද්‍රණය සඳහා අවශ්‍ය අනෙකුත් ද්‍රව්‍ය ද ආනයනය සඳහා රු. මිලියන 5745ක් අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ප්‍රතිපාදන සඳහා වෙන්කර ගැනීමට සහ ඒ අනුව එම ද්‍රව්‍ය ආනයනය සඳහා ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඇත.

පැවති කඩදාසි හිඟය ලොතරැයි මුද්‍රණය සඳහා ද දැඩිව බලපෑ අතර විටෙන් විට නිෂ්පාදනය අඩාල වීමෙන් සිදු වූ ප්‍රමාදය නිමා කරලමින් ජාතික කඩදාසි සමාගම සමග 2022.09.01 දින ගිවිසුම්ගත වෙමින් ලොතරැයි මුද්‍රණය සඳහා අවශ්‍ය කඩදාසි අඛණ්ඩව ලබා ගැනීමට මේවන විට පියවර ගෙන ඇත.

එමෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ රු. මි. 203 ක වියදමින් ජපාන රජයෙන් Kumori මුද්‍රණ යන්ත්‍රය මෙම වසරේ මිලට ගත් අතර, එමගින් පෙළපොත් හා වාණිජ මුද්‍රණ කටයුතු ගුණාත්මක භාවයෙන් යුතුව ඉතා උසස් නිමාවකින් ලබා දීමට අපට හැකියාව ලැබී ඇත. එය මුද්‍රණයේ නව සන්ධිස්ථානයක් ලෙස මම දකිමි.

එමෙන්ම රජය විසින් හඳුන්වා දෙන ලද වගා සංග්‍රාම වැඩසටහන අනුව අධ්‍යාපන අමාත්‍යවරයාගේ මඟ පෙන්වීම යටතේ අප සංස්ථාවේ ඇති අක්කර ගණනාවක හිස් ඉඩම්හි ඝන කැලෑව එළි පෙහෙළි කර වගා කටයුතු ආරම්භ කළ අතර, සියලු සේවක මහත්ම මහත්මීන්ගේ මහන්සියෙන් සංස්ථා භූමිය මේවන විට ඉතා සරු ගොවිපළක් ලෙස නිර්මාණය වී ඇති අතර, එහි පලදාව ද මේ වන විට භුක්ති විඳිමින් සිටී.

සියලු මුද්‍රණ කටයුතුවලින් මෙම ආයතනයට ලැබෙන කීර්තිය සුළු පටු නොවන අතර එය තවදුරටත් වර්ධනය කරමින් සේවක සුභ සාධනය සඳහා කැපවීමත්, විධිමත් මූල්‍ය සැලැස්මක් මගින් ඉදිරි වසර කිහිපය සංස්ථාවට මූල්‍ය ශක්තියක් ගෙන දීමත් මාගේ ඒකායන බලාපොරොත්තුව වන අතර, මේ සඳහා සියලු සේවක මහත්ම මහත්මීන් සමග එක්ව දූෂණය පිටුදැක සංස්ථාව ඉදිරියට රැගෙන යාම මාගේ අපේක්ෂාව වේ.

මෙම වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේදී ඊට සහයෝගය දැක් වූ අධ්‍යක්ෂ මණ්ඩලය, සාමාන්‍යාධිකාරිතුමා ඇතුළු නිලධාරී මණ්ඩලයට මාගේ ස්තුතිය පිරිනමමි.

ජේ. එම්. ඒ. බී. ජයසේකර
(BSc Mgt, FCA, FCMA, FPFA, FMAAT)
සභාපති
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
2022. 10. 17

2020

අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

ජනක රත්නකුමාර මහතා

අධ්‍යක්ෂ මණ්ඩලය

1. විජිත නන්දකුමාර මහතා
2. ඊ. ජී. එච්. එම්. රණසිංහ මහතා
3. එච්. එල්. ඩබ්. ගාමිණී මහතා
4. ඩී. එච්. කණ්ඩම්බි මහතා
5. එච්. ටී. එල්. චාමිකර මහතා
6. යූ. ජී. එස්. රංගජීව මහතා

2020

විධායක නිලධාරී මණ්ඩලය

මුදල් කළමනාකරු (වැ.බ.)
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

සැපයුම් කළමනාකරු
ඊ. වී. කේ. කීර්තිරත්න මහතා

වැඩ කළමනාකරු
ටී. එම්. ආර්. එන්. තෙන්නකෝන් මහතා

නියෝජ්‍ය වැඩ කළමනාකරු
එස්. ඩී. කුමාරසිංහ මහතා

කළමනාකරු (ලිපි ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව)
එල්. ටී. ප්‍රේමසිරි මහතා

ගණකාධිකාරි
එම්. ආර්. පී. ජයවර්ධන මහතා

අභ්‍යන්තර විගණක
එම්. එස්. එස්. මොහොට්ටි මහතා

සහකාර කළමනාකරු වැඩ (ඇස්තමේන්තු)
කේ. ඩී. ටී. චන්ද්‍රසිරි මහතා

සහකාර කළමනාකරු වැඩ (සුරක්ෂා)
එම්. ඒ. කොතලාවල මහතා

සහකාර කළමනාකරු වැඩ (පොත් බැඳීම්)
පී. කේ. තිලක් මහින්ද මහතා

සහකාර කළමනාකරු (විකුණුම්)
එච්. ආර්. ගුණසේකර මහතා

සහකාර කළමනාකරු (තොරතුරු තාක්ෂණ)
ආර්. එම්. ඒ. පී. බී. රාජකරුණා මහතා

සහකාර කළමනාකරු
(පරිපාලන හා මානව සම්පත් සංවර්ධන)
එන්. වී. එන්. ආර්. ආශිංශනී මිය

සහකාර කළමනාකරු
(නීති/අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)
ඒ. එල්. ආර්. මධුකානි මහත්මිය

සහකාර කළමනාකරු (ප්‍රකාශන)
මධුරංග සී. නුවන්ප්‍රිය මහතා

සහකාර කළමනාකරු (සැපයුම්)
යූ. අනිල් ජයකාන්ත මහතා

ගණකාධිකාරි
ඩබ්. ඒ. ඒ. එස්. ජයසුන්දර මහතා

සහකාර කළමනාකරු වැඩ (නඩත්තු)
එන්. ජී. එල්. චන්දිමාල් මහතා

ගණකාධිකාරි
එන්. යූ. එස්. ද සිල්වා මහතා

2020

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාව

1971 අංක 38 දරන මුදල් පනතේ 14 වන වගන්තියේ කොන්දේසි ප්‍රකාරව 2020 දෙසැම්බර් 31 වෙනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක වූ වැඩ පිළිවෙළ ඇතුළත් සිය 52 වෙනි වාර්තාව රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුටින් මෙසේ ඉදිරිපත් කරයි.

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 06 ක් පවත්වන ලදී.

01. නිෂ්පාදනය

1.1 පාසල් පෙළ පොත්

1.1.1 පාසල් පෙළ පොත් මුද්‍රණය

පාසල් පෙළ පොත් මුද්‍රණය මූලික අරමුණ කර ගනිමින් පිහිටුවනු ලැබූ සංස්ථාව විවෘත ආර්ථිකය හඳුන්වා දීමත් සමගම වෙනත් නිෂ්පාදන අංශ කරා යොමුවී ඇත. ඒ සමගම පාසල් පොත් මුද්‍රණය සෘජුව සංස්ථාව වෙත පැවරීම වෙනුවට ටෙන්ඩර් මගින් තරගකාරීව අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ඇණවුම් ලබා ගැනීමට සංස්ථාවට සිදුවිය. එහෙත් එම ක්‍රමය වෙනස් කරමින් 2020 වර්ෂයේදී ද ටෙන්ඩර් පටිපාටියෙන් පරිබාහිරව පෙළ පොත් මුද්‍රණය සංස්ථාවට පැවරීමට කැබිනට් අනුමැතිය ලැබිණි. ඒ අනුව 2020 වසරේ දී ද පාසල් පෙළ පොත් පිටපත් මිලියන 15.91 ක් මුද්‍රණය කර දෙමින් සංස්ථාවට රු. මිලියන 1297.850 ක ආදායමක් ලැබුණි.

සමාලෝචිත වර්ෂයේ මුද්‍රණය කළ පාසල් පෙළ පොත් පිටපත් සංඛ්‍යාව හා ඉන් ලද ආදායම 2018 හා 2019 ට සාපේක්ෂව පහත දැක්වේ.

පාසල් මුද්‍රණ වැඩ	2018 ('000)	2019 ('000)	2020 ('000)
පිටපත් සංඛ්‍යාව	4,485	11,012	15,910
ආදායම - රු.	428,627	1,090,416	1,297,850

පාසල් පෙළ පොත්



පාසල් පෙළ පොත්



1.2 වෙනත් මුද්‍රණ සේවා

සමාලෝචිත වර්ෂය තුළදී දහම් පාසල් පොත් මුද්‍රණය ආරක්ෂිත මුද්‍රණ සේවා (ලොතරැයිපත්, බැංකු තැන්පත් පත්, ලේබල්, එයාපෝර්ට් සුපර් ඩ්‍රෝ යනාදිය) සහ රාජ්‍ය ආයතන සඳහා මුද්‍රණ සේවා සපයන ලදී. එමෙන්ම විවිධ ආයතන සඳහා දිනපොත්, කැලැන්ඩර් යනාදිය මුද්‍රණය කරන ලදී. මීට අමතරව විවිධ ආයතනවල මුද්‍රණ කාර්යයන් ද ඉටු කරන ලදී. විශේෂ මුද්‍රණ සේවා කිහිපයක් පහත පරිදි වේ.

1.2.1 සුරක්ෂා මුද්‍රණ සේවා

ජාතික ලොතරැයි මණ්ඩලය සඳහා මහජන සම්පත ලොතරැයිය දැනට වසර 46ක පමණ කාලයක් මුද්‍රණය කරන ලදී. මීට අමතරව මෙගා පවර්, නීරෝගා, දරු දිරි සම්පත ලොතරැයිය ද මුද්‍රණය කරනු ලැබේ. ලොතරැයි මණ්ඩලයෙන් ලද සියලුම ඇණවුම් මුද්‍රණය කර දුන් අතර, 2020 වසරේදී මුද්‍රණය වූ ලොතරැයි ප්‍රමානය මිලියන 534,727 කි. ඒ අනුව ආදායම රු. මිලියන 299,447ක් වී ඇත. ලොතරැයි මුද්‍රණයේ ආදායම හා පිටපත් සංඛ්‍යාව පහත සඳහන් පරිදි වේ.

ලොතරැයි මුද්‍රණ වැඩ	2018 ('000)	2019 ('000)	2020 ('000)
පිටපත් සංඛ්‍යාව	427,415	524,474	534,727
ආදායම - රු.	248,011	293,440	299,447

සුරක්ෂා මුද්‍රණය



ලොතරැයි ප්‍රමාණය

සුරක්ෂා මුද්‍රණය



ආදායම

1.2.2 වෙනත් මුද්‍රණ සේවා

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සඳහා මෙන්ම පෞද්ගලික අංශයේ ඇණවුම් ලබා ගැනීම කෙරෙහි විශේෂ උනන්දුවකින් ක්‍රියා කරන ලදී. ඉටු කරන ලද විශේෂ මුද්‍රණ සේවා අතර පහත සඳහන් සේවා ප්‍රධාන තැනක් ගන්නා ලදි.

01. විවිධ ආයතනයන් සඳහා වූ වාර්ෂික වාර්තා
02. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව සඳහා වූ විවිධ මුද්‍රණ වැඩ
03. විශ්වවිද්‍යාල සහතික පත්
04. ජාතික සත්වෝද්‍යානයට අයත් ප්‍රවේශ පත්‍ර හා අනෙකුත් විස්තර පත්‍රිකා
05. සිනමාශාලා ටිකට්පත්
06. සේවක අර්ථසාධක අරමුදලේ විවිධ මුද්‍රණ වැඩ
07. ජාතික ඉතිරි කිරීමේ බැංකුවට අයත් මුද්‍රණ කටයුතු
08. විභාග දෙපාර්තමේන්තුව සඳහා මුද්‍රණය කරන ලද උත්තර ලියන කඩදාසි පොත්

සමාලෝචිත වර්ෂයේදී විවිධ මුද්‍රණ වැඩ ඉටු කරමින් සංස්ථාව ලත් ආදායම රු. මිලියන 70 කි.

1.3 අභ්‍යාස පොත් සහ අනෙකුත් පොත් නිෂ්පාදනය

2020 වසරේ දී නිෂ්පාදනය පහත පරිදි වේ.

විස්තරය	නිෂ්පාදන ප්‍රමාණය	වටිනාකම (රුපියල්)
අභ්‍යාස පොත් (පිටු 80 පොත් වලින්)	මිලියන 4.449	මිලියන 113.685
සී. ආර්. පොත් (පිටු 80 සී.ආර්. පොත් වලින්)	මිලියන 0.845	මිලියන 52.208
වෙනත් ලිපිද්‍රව්‍ය නිෂ්පාදන (ඒකක වලින්)	මිලියන 0.059	මිලියන 6.134
එකතුව	මිලියන 5.354	මිලියන 172.026

සමාලෝචිත වර්ෂයේදී ලිපිද්‍රව්‍ය අංශයේ නිෂ්පාදනය 2018 හා 2019 වසරවලට සාපේක්ෂව පහත පරිදි වේ.

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත්	2018 ('000)	2019 ('000)	2020 ('000)
පොත් පිටපත් සංඛ්‍යාව	7,220	5,766	5,354
ආදායම - රු.	238,333	187,035	172,026

13/3/2020 සිට 31/5/2020 දක්වා (දින 80) කොවිඩ් 19 වසංගත තත්වය හේතුවෙන් නිෂ්පාදනය ඇනහිටීම හා 1/6/2020 සිට 25/07/2020 දක්වා (දින 54) කාල පරාසය තුල ලියන කඩදාසි තොග නොලැබීම නිසා 2020 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක කරා ලගාවීමට නොහැකි විය.

2020 වසරේ නිෂ්පාදන ඉලක්කය : මිලියන 6,64

(වටිනාකම රු. මිලියන 234)

අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත පිටපත් සංඛ්‍යාව



අභ්‍යාස පොත් හා අනෙකුත් පොත් සමස්ත ආදායම



02. අලෙවි හා විකුණුම්

වර්ෂය	2018 රු.	2019 රු.	2020 රු.
සමස්ත ආදායම (බදු ඇතුළත්)	282,021,852.00	153,082,388.79	149,717,779.84

2020 වර්ෂයේදි සමස්ථ අලෙවි ආදායම විශාල වශයෙන් අඩු වීමක් සිදු වී ඇත.

2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂයේ අභ්‍යාස පොත් ආදායම අඩුවීමේ ප්‍රතිශතය වූ 45.71% ප්‍රමාණය 2020 වර්ෂයේදී 2.19% දක්වා පහත වැටී ඇත. ආදායම් අඩුවීමට ප්‍රධාන හේතුව ලෙස 2019 වර්ෂයේ අභ්‍යාස පොත් නිෂ්පාදනය සඳහා රට තුළ පැවති කොවිඩ් තත්ත්වය හමුවේ සිදු වූ සංචරණ සීමා හේතුවෙන් නිෂ්පාදනය පෙර වර්ෂවලට සාපේක්ෂව පහත වැටිණි.

මීට අතිරේකව බාහිර ආයතන මගින් මිලට ගෙන නැවත අලෙවි කිරීමට යොදාගන්නා ලිපිද්‍රව්‍ය අයිතමයන් 2019 වර්ෂය තුල අපේක්ෂිත පරිදි සපයා ගැනීමට නොහැකි වීම අපේක්ෂිත ආදායම් අඩුවීමට හේතු වී ඇත.

ඉහත ගැටලු තත්ත්වයන් ඇති නොවූයේ නම් එම වර්ෂය තුළ ආදායම තවදුරටත් 15% අතර ප්‍රමාණයකින් ඉහළ නංවා ගැනීමේ හැකියාව පැවතිණි.

සමස්ත අලෙවිය



ප්‍රකාශන සේවා

2019 වර්ෂයට සාපේක්ෂව 2020 වර්ෂයේදී ප්‍රකාශන ආදායම සැලකිය යුතු අඩු වීමක් පෙන්නුම් කරයි. සමාලෝචිත වර්ෂයේදී එහි පසුබෑමක් පෙන්නුම් කරයි. මෙම වර්ෂය තුළ නව සංස්ථා ප්‍රකාශන 02ක් පලකර ඇත.

2020 ප්‍රකාශිත නව කෘති ගණන	02
2018 ලද ප්‍රකාශන ආදායම	මිලියන 5.2
2019 ලද ප්‍රකාශන ආදායම	මිලියන 2.3
2020 ලද ප්‍රකාශන ආදායම	මිලියන 5.8

03. ස්ථාවර වත්කම්

2020 වර්ෂය අවසානයේ දී සංස්ථාව සතු ස්ථාවර වත්කම්වල මුළු පිරිවැය රු. 1,176,497,089/- විය. එහි ශුද්ධ වටිනාකම රු. 945,054,250/- කි. මෙම තත්ත්වය මීට පෙර එනම් 2019 වසර හා සැසඳීමේ දී පිළිවෙළින් රු. 1,168,708,786/- ක් හා රු. 991,125,221 ක් වශයෙන් විය.

ස්ථාවර වත්කම්	2018 රු.('000)	2019 රු.('000)	2020 රු.('000)
ආරම්භක වටිනාකම (පිරිවැයට)	1,148,393	1,168,709	1,176,497
වර්ෂ අවසාන ශුද්ධ වටිනාකම	1,039,094	991,125	945,054

04. බදු බැඳියාව

සංස්ථාව තක්සේරු වර්ෂ 2019/2020 සඳහා ආදායම් බදු හා ලාභාංශ බදු ලෙස කිසියම් හෝ මුදලක් සංස්ථාවේ 2019 වසරේ අවසාන ගිණුම් අනුව ප්‍රතිපාදනය කොට නොමැත.
(සංස්ථාව ශුද්ධ අලාභ තත්වයක පැවතීම නිසා)

බදු බැඳියාව	2018 රු. ('000)	2019 රු. ('000)	2020 රු. ('000)
ආදායම් බදු	-	-	-
ලාභාංශ බදු	-	-	-
එකතුව	-	-	-

05. ලාභය

2020 වසර තුළ දී සංස්ථාව රු. 22,914,300 ක බදු පූර්ව ලාභයක් උපයා ඇති අතර, 2019 වසරේ දී රු. 169,428,397/- ක අලාභයක් විය.

ලාභදායිකාව	2018 රු. ('000)	2019 රු. ('000)	2020 රු. ('000)
බදු පූර්ව ලාභය	(406,985)	(169,428)	22,914
බදු ප්‍රතිපාදනයෙන් පසු	(406,985)	(169,428)	22,914



06. ප්‍රසාද දීමනා

2016 වසරේ සිට සංස්ථාව අඛණ්ඩව අලාභදායීත්වයක් ලැබූ හෙයින් 2020 වසර සඳහා ප්‍රසාද දීමනා මුදලක් සංස්ථා සේවකයින්ට නොගෙවූ අතර, ඒ වෙනුවට 2021 වසරේදී සේවක ඉල්ලීම් පදනම් කරගනිමින් සේවකයින් අභිප්‍රේරණය ඇති කිරීම සඳහා සේවක කාර්යසාධනය සහ ඉතිරි නිවාඩු පදනම් කරගනිමින් විශේෂ දිරි දීමනාවක් ගෙවීමට කටයුතු කර ඇත.



ප්‍රසාද දීමනා	2018 රු. ('000)	2019 රු. ('000)	2020 රු. ('000)
	1,408	22,097	-

07. සුභ සාධනය

පහත සඳහන් සුභ සාධන සේවා හා පහසුකම් පසුගිය වර්ෂයේ පදනම යටතේ මෙම වසර තුළදී ද පවත්වා ගෙන යන ලදී. මේ වෙනුවෙන් සංස්ථාව වැය කළ මුළු මුදල රු. මිලියන 42 ක් විය.

	සුභ සාධනය	2018 රු.('000)	2019 රු.('000)	2020 රු.('000)
01.	සේවක ප්‍රවාහන පහසුකම්	10,879	8,503	6,962
02.	සේවක දිරි දීමනා ගෙවීම්	5,263	4,784	4,815
03.	වෛද්‍යාධාර ප්‍රතිලාභ ගෙවීම	10,046	9,431	8,158
04.	සේවක විවිධ සුභ සාධනය	24,204	21,171	18,936
05.	කම්කරු වන්දි ආරක්ෂණය	-	-	-
06.	සියලුම සේවකයින් සඳහා ලිපිද්‍රව්‍ය තෑගි වවුචරයක් ප්‍රදානය කිරීම	1,703	1,378	1,447
07.	සේවක ප්‍රසාද දීමනා	1,408	22,097	-
08.	සේවක නිවාස ණය ප්‍රතිපූරණය	2,573	2,087	1,773
09.	සේවක ඉතිරි නිවාඩු සඳහා ගෙවීම	13,615	13,210	-
10.	විශේෂ දිරි දීමනා	-	15,675	-
	එකතුව	**69,748**	**98,336**	**42,091**

08. සේවක මණ්ඩලය

2020. 12. 31 දිනට සංස්ථාවේ සේවක සංඛ්‍යාව 584 කි.

සේවක සංඛ්‍යාව	2020
කාර්යාලය	129
ප්‍රධාන මුද්‍රණාලය	313
ලිපිද්‍රව්‍ය කම්හල	57
ආරක්ෂක අංශය	48
අලෙවිසැල්	37
මුළු සේවක සංඛ්‍යාව	**584**

2020 වර්ෂය තුළ දී සේවයට බඳවාගෙන ඇති නිලධාරීන්

	නම/තනතුර	පත් වූ දිනය
1.	එන්. වී. කේ. ආශිංශනී මිය - සහ. කළමනාකරු (පරිපාලන හා මා.ස.ස.)	2020. 07. 01
02.	ආර්. එම්. ඒ. පී. බී. රාජකරුණා මහතා - සහ. කළමනාකරු (තොරතුරු තාක්ෂණ)	2020. 10. 20

2020 වර්ෂය තුළ දී සේවයෙන් ඉවත් වූ නිලධාරීන්

	නම/තනතුර	ඉවත් වූ දිනය
1.	එම්. ටී. ජේ. පෙරේරා මහතා - අලෙවි කළමනාකරු	2020. 08. 25
02.	ඩබ්. ඩබ්. එම්. ආරච්චිගේ මහතා - සහ. කළමනාකරු (ආරක්ෂක)	2020. 09. 22
03.	එස්. ටී. කරුණාරත්න මහතා - සාමාන්‍යාධිකාරී	2020. 12. 19

සමාප්තිය

සංස්ථාවේ වැඩ කටයුතු ඉතා සාර්ථක ලෙස කර ගෙන යාම සඳහා ඉතා ලැදිව සහයෝගය දුන් සංස්ථාවේ සියලු සේවකයන්ට සභාපතිතුමා ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ. සාර්ථක වැඩ පිළිවෙළක් සඳහා සෑම විටම මග පෙන්වීම කරමින් සහාය ලබාදුන් ගරු අධ්‍යාපන අමාත්‍යතුමාටත්, එම වැඩ පිළිවෙළට නිරතුරුව සහයෝගය ලබාදුන් අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත් අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්තුතිය පිරිනැමේ.

ඉදිරි වර්ෂය තුළදී ද එවැනිම සහයෝගයක් හා ප්‍රතිචාරයක් සංස්ථාවේ සියලු සේවකයින්ගෙන් පාලනාධිකාරිය බලාපොරොත්තු වන්නේය.

ජේ. එම්. යූ. බී. ජයසේකර
සභාපති

2020

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම	7	1,843,090,170	1,593,815,189
විකුණුම් පිරිවැය	8	(1,494,208,078)	(1,320,149,485)
දළ ලාභය		**348,882,092**	**273,665,704**
වෙනත් මෙහෙයුම් ආදායම	9	20,240,846	20,065,417
බෙදාහැරීමේ වියදම්	10	(21,775,010)	(39,039,429)
පරිපාලන වියදම්	11	(170,176,441)	(184,930,860)
වෙනත් මෙහෙයුම් සඳහා වියදම්	12	(35,876,369)	(92,281,928)
මෙහෙයුම් ලාභය		141,295,117	(22,521,097)
මූල්‍ය ආදායම		1,977,815	2,256,626
මූල්‍ය වියදම්	13	(120,358,632)	(149,163,926)
බදු පෙර ලාභය		**22,914,300**	**(169,428,397)**
ආදායම් බදු	14	-	-
විලම්භිත බදු	21	-	-
බදු පසු ලාභය		**22,914,300**	**(169,428,397)**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය

	2020 රු.	2019 රු.
වාර්ෂික ලාභය (බදු පසු)	**22,914,300**	**(169,428,397)**
වෙනත් විස්තීරණ ආදායම්	-	-
ප්‍රත්‍යාගණන ලාභය	-	-
වර්ෂය තුළ මුළු විස්තීරණ ආදායම්	**22,914,300**	**(169,428,397)**

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශන

	සටහන	2020 රු.	2019 රු.
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	15	945,054,250	991,125,221
විලම්බිත බදු වගකීම්	21	-	17,105,398
		945,054,250	**1,008,230,619**
ජංගම වත්කම්			
තොගය	16	306,106,350	275,133,678
වෙළඳ ලැබිය යුතු ශේෂය	17	613,179,690	393,268,112
වෙනත් ලැබිය යුතු ශේෂයන්	18	28,826,335	28,942,689
පූර්ව ගෙවීම්		255,645	386,775
මුදල් හා මුදල්වලට සමාන දෑ	19	36,135,080	31,459,352
මුළු ජංගම වත්කම්		984,503,100	729,190,607
මුළු වත්කම්		**1,929,557,350**	**1,737,421,226**
ස්කන්ධය හා බැරකම්			
ප්‍රාග්ධන නිකුතුව		15,000,000	15,000,000
සංචිත		-	15,003,633
රඳවා ගත් ඉපයීම්		(582,917,657)	(648,559,110)
එකතු කළාඃ ප්‍රත්‍යාගණන ලාභ		808,011,707	808,011,707
මුළු ස්කන්ධය		**240,094,050**	**189,456,230**
ජංගම නොවන බැරකම්			
බැංකු ණය - දිගු කාලීන	20	92,917,055	136,642,139
විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්		174,793,353	191,707,011
එකතුව - ජංගම නොවන බැරකම්		**267,710,408**	**328,349,150**
ජංගම බැරකම්			
වෙළඳ ගෙවිය යුතු ශේෂයන්	22	328,246,396	240,546,047
වෙනත් ගෙවිය යුතු ශේෂයන්	23	39,804,411	71,885,027
කෙටි කාලීන ණය - (ණය පොළී සහිත)	24	985,463,449	840,717,598
ගෙවිය යුතු ණය ශේෂය (පොළී රහිතව මිලදී ගැනීම්)		24,326,804	46,765,102
බැංකු අයිරා		43,911,832	19,702,073
මුළු ජංගම බැරකම්		**1,421,752,892**	**1,219,615,846**
මුළු ස්කන්ධය හා බැරකම්		**1,929,557,350**	**1,737,421,226**

සංස්ථාවේ මෙම මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මූල්‍ය පනතේ අවශ්‍යතාවන්ට අනුකූල බව සහතික කරමු.

.....
ජී. එම්. ඩී. එච්. එස්. ගම්ලත්
මුදල් කළමණාකරු

මෙම මූල්‍ය ප්‍රකාශන සැකසීම හා ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වගකීම් දරයි. ඒවා අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇති අතර ඔවුන් වෙනුවෙන් අත්සන් තබා තිබේ. පිටු අංක 20, 21 සහ 22 හි ඇතුළත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 15, 16 මෙන්ම 23 සිට 28 දක්වා ඇතුළත් අදාළ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල වැදගත්ම අංග වේ.

.....
ඩී. ඩී. එච්. ජේ. ඒ. රත්නකුමාර
සභාපති/අධ්‍යක්ෂ

.....
ජී. වී. නන්දකුමාර්
අධ්‍යක්ෂ

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා හිමිකම වෙනස්වීමේ ප්‍රකාශය

	ප්‍රාග්ධන නිකුතුව රු.	ප්‍රාග්ධන සංචිතය රු.	පොදු සංචිතය රු.	සංවර්ධන සංචිතය රු.	ප්‍රත්‍යාගණන ලාභය රු.	රඳවාගත් ඉපැයීම් රු.	එකතුව රු.
2019 ගිණුම්							
2019. 01. 01 වැනි දිනට ශේෂය	15,000,000	102,491	1,000,000	13,901,142	808,011,707	(446,833,123)	391,182,216
පෙර වර්ෂයේ ගැළපීම්						(32,297,591)	(32,297,590)
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						(169,428,397)	(132,297,346)
ප්‍රත්‍යාගණන ලාභය							
2019. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**102,491**	**1,000,000**	**13,901,142**	**808,011,707**	**(648,559,111)**	**226,587,280**
2020 ගිණුම්							
2020. 01. 01 දිනට ශේෂය	15,000,000	102,490	1,000,000	13,901,142	808,011,707	(648,559,111)	189,456,228
පෙර වර්ෂයේ ගැළපීම්						42,727,155	42,727,155
වර්ෂය සඳහා ගැළපීම්		(102,490)	(1,000,000)	(13,901,142)			(15,003,632)
ලාභය/(පාඩුව) වසර සඳහා (බදු පසු)						22,914,300	22,914,300
ප්‍රත්‍යාගණන ලාභය							-
2020. 12. 31 දිනට ශේෂය	**15,000,000**	**-**	**-**	**-**	**808,011,707**	**(582,917,657)**	**240,094,051**

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	2020 රු.	2019 රු.
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය		
බදු පෙර ලාභය	22,914,300	(169,428,397)
ගැළපීම්:		
ස්ථාවර වත්කම් ක්ෂය	53,859,274	61,465,802
ජංගම නොවන වත්කම් විකුණුම් ලාභය	-	-
පෙර වර්ෂයේ ගැළපීම් (Effected to Cash Flow)	44,828,920	(37,836,055)
මූල්‍ය වියදම්	120,358,632	149,163,926
පාරිතෝෂික සඳහා වසර තුළ වෙන්කළ ප්‍රතිපාදන	-	6,545,373
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන් කිරීම	5,762,226	9,028,466
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු වෙන් කිරීම් සඳහා ගෙවීම්	(9,028,466)	
බොල්ණය සඳහා වෙන් කිරීම	1,984,063	5,597,804
මුද්‍රණ කටයුතු සඳහා ලිපිද්‍රව්‍යවලට වෙන් කිරීම්	1,447,150	-
කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර මෙහෙයුම් ලාභය	**242,126,099**	**24,536,919**
කාරක ප්‍රාග්ධන වෙනස්වීම		
තොගය (වැඩිවීම) / අඩුවීම	(30,972,672)	163,365,732
(වැඩිවීම්)/වෙළඳ ලැබීම් අඩුවීම	(218,629,402)	(108,206,398)
(වැඩිවීම්)/වෙනත් ලැබීම්වල හා පෙර ගෙවීම්	247,484	17,049,570
ජංගම බැරකම්වල වැඩි/(අඩුවීම)	31,734,285	93,375,394
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය	**24,505,795**	**190,121,218**
ගෙවූ බදු	-	(1,700,000)
සේවක විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීම	(16,913,658)	(29,993,918)
මෙහෙයුම් කටයුතුවලින් ගලා ආ ශුද්ධ මුදල් ප්‍රවාහය	**7,592,137**	**158,427,300**
ආයෝජන කටයුතුවලින් ගලා ආ මුදල් ප්‍රවාහය		
ස්ථාවර වත්කම් අලෙවිය තුලින් ජනනය වූ	-	-
ස්ථාවර වත්කම් මිලදී ගැනීම් තුලින් ජනනය වූ	(7,788,303)	(13,496,714)
ආයෝජන කටයුතුවලින් ශුද්ධ මුදල් ගලාඒම	**(7,788,303)**	**(13,496,714)**
මූල්‍ය කටයුතුවලින් මුදල් ගලා ඒම		
ණය ලබා ගැනීම/ගෙවීම් තුලින් (ශුද්ධ ණය)	101,020,768	32,498,822
පොළී ගෙවීම්	(120,358,632)	(149,163,926)
මූල්‍ය කටයුතුවලින් ශුද්ධ මුදල් ගලා ඒම	**(19,337,864)**	**(116,665,104)**
ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්) මුදල් හා මුදල්වලට සමාන දෑ	(19,534,030)	28,265,482
කාලසීමාව ආරම්භයේ මුදල් හා මුදල්වලට සමාන දෑ	11,757,279	(16,508,203)
කාලසීමාව අවසානයේ මුදල් හා මුදල්වලට සමාන දෑ (සටහන 19)	**(7,776,751)**	**11,757,279**

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්
2020 දෙසැම්බර් 31 වැනිදා වන විට

1. සංස්ථාව පිළිබඳ තොරතුරු

1.1 වාර්තාකරණ ආයතනය

1968 අංක 24 දරන පාර්ලිමේන්තු පනතට අනුව රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව 1968 වසරේදී ස්ථාපනය කෙරිණි. ආයතනික අධ්‍යක්ෂ මණ්ඩලය එහි කළමනාකාරීත්වය භාරව ක්‍රියා කරයි.
පාදුක්ක, පානඵව ප්‍රදේශයේ මෙය පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් හා මෙහෙයුම්වල ස්වභාවය

සංස්ථාවේ ප්‍රධාන කාර්යයන් වන්නේ පාසල් පෙළ පොත් මුද්‍රණය, අභ්‍යාස පොත් නිෂ්පාදනය හා වෙනත් මුද්‍රණ කාර්යයන් සිදු කිරීමයි.

2. ගිණුම් ප්‍රමිතීන් හා පිළියෙල කිරීමේ පදනම

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය, ආදායම් පිළිබඳ පුළුල් ප්‍රකාශනය, අරමුදල් හා මුදල් ගලා ඒමේ වෙනස්කම් සහ ප්‍රතිපත්ති මෙන්ම සටහන් සකසා ඇත්තේ LKAS සහ SLFRS යන ගිණුම්කරණ ප්‍රමිතීන් හා 1971 අංක 38 දරන මූල්‍ය පනතට අනුවය.

2.1 අනුකූලතා ප්‍රකාශය

උපචිත පදනම හා ඓතිහාසික පිරිවැය පදනම් කර ගනිමින් මූල්‍ය ප්‍රකාශනය සකසා තිබේ.
ශ්‍රී ලංකා රුපියල්වලින් එය ඉදිරිපත් කර ඇත.

2.2 ඇගයුම් පදනම

පහත සඳහන් කරුණු හැර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබෙන්නේ ඓතිහාසික පිරිවැය පදනම් කර ගෙනය.

* විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සඳහන් පොලී ආදායම
* ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම්

2.3 අඛණ්ඩ පැවැත්ම

සංස්ථාව පවත්වා ගෙන යාමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය තක්සේරුවක් සිදු කොට අවධානය යොමු කර ඇත. කෙසේ වෙතත් එය ඇවර කිරීමට හෝ මෙහෙයුම් නතර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය අපේක්ෂා නොකරයි.

2.4 භාවිතාවන ව්‍යවහාර මුදල්

අවසාන ගිණුම් ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ ව්‍යවහාර මුදල් වූ ශ්‍රී ලංකා රුපියල්වලිනි.
සියලුම මූල්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇත්තේ රුපියල්වලින් වන අතර ආසන්න රුපියලේ අගයට වටිනාකම් දක්වා ඇත.

2.5 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් කලින් අවුරුදුවල අනුගමනය කළ ගිණුම් ප්‍රතිපත්තීන් නොවෙනස්ව ඒ ආකාරයෙන් අනුගමනය කර ඇත. අවශ්‍ය අවස්ථාවල කලින් අවුරුදුවල වටිනාකම් හා සඳහන් කිරීම් නැවත සකසා ඉදිරිපත් කිරීම් කර ඇත. සංස්ථාව විසින් ඉකුත් වර්ෂවලට අදාළ වැරදි නිවැරදි කිරීම් අතීතානුයෝගීව ගළපා ඉකුත් වර්ෂයේ මූල්‍ය තත්වය නැවත ප්‍රකාශ කර ඇත.

3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති පිළිබඳ සාරාංශය

පහත සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සියලුම කාලපරිච්ඡේදයන් සඳහා ඒකාකාරී ලෙස නොකඩවා සංස්ථාව විසින් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර ඇත.

3.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ, පිරියත හා උපකරණ සඳහන් කර ඇත්තේ එකතු ක්ෂයවීම් අඩු කරන ලද ශුද්ධ පිරිවැය හෝ ප්‍රත්‍යාගණන වටිනාකම වේ.

පහත සඳහන් දිනවල තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වත්කම් තක්සේරු කරන ලදී.

ඉඩම් හා ගොඩනැගිලි	-	02. 01. 2017 සිට 06. 01. 2017 දක්වා
කාර්යාලයීය උපකරණ ලී බඩු හා සවිකිරීම් පරිගණක උපාංග	-	02. 01. 2017 සිට 30. 01. 2017 දක්වා
යන්ත්‍ර හා පිරියත	-	16. 01. 2017 සිට 30. 01. 2017 දක්වා
මෝටර් රථවාහන	-	13. 01. 2016 සිට 14. 01. 2016 දක්වා

වත්කම් ප්‍රත්‍යාගණනයේ වෙනස හෝ ලාභය විස්තීරණ ආදායම තුළ දක්වා ඇති අතර හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය තුළ ප්‍රත්‍යාගණන සංචිතය නමින් ප්‍රත්‍යාගණන ලාභය දක්වා ඇත.
වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසු කාර්යාලීය උපකරණ සහ ලී බඩු හා සවිකිරීම් එකම පංතියක් ලෙසත් උපකරණ මෙවලම් සහ අත් කරත්ත තවත් පංතියක් ලෙසත් වර්ගීකරණය කර ඉදිරිපත් කර ඇත.

3.1.1 ක්ෂයවීම්

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවකාලය පිළිබඳ තක්සේරුවකින් පසු සරල මාර්ග ක්‍රමයට ක්ෂය වීම් ගණනය කරනු ලැබේ.

තක්සේරු කරන ලද වත්මන් හා සංසන්දනාත්මක ඵලදායී ජීවකාලය පහත පරිදි වේ.

ගොඩනැගිලි	වසර 40 යි
පිරියත හා යන්ත්‍රෝපකරණ	වසර 13.33 යි
මෝටර් හා වෙනත් වාහන	වසර 04 යි
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	වසර 10 යි
පරිගණක හා උපාංග	වසර 03 යි

3.2 තොගය

තොගය පිරිවැය හා ශුද්ධ උපලබ්ධිත අගය යන අගයන්ගෙන් අවම අගයට ගණනය කර ඇත.

3.3 බදුකරණය

3.3.1 ආදායම් බදු

අදාළ වර්ෂයේ සහ පෙර වර්ෂවලට අදාළ ආදායම් බදු බැරකම් හෝ වත්කම් දේශීය ආදායම් කොමසාරිස් වෙත ගෙවීමට හෝ අයකර ගැනීමට කටයුතු කරනු ලැබේ.

ආදායම් බදු ගණනය කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන් කර ඇති දිනට වලංගු බදු ප්‍රතිශතයන් සහ එදිනට නීතිරීතිවලට අනුව කටයුතු කරනු ලැබේ. ආදායම් බදු සඳහා වෙන් කිරීමේදී මූල්‍ය ප්‍රකාශනවල සඳහන්ව ඇති ආදායම් සහ වැය ප්‍රභවයන්ට අනුව 2006 වර්ෂයේ දේශීය ආදායම් පනතේ 10 වන ඡේදයට අනුව සහ ඉන් පසුව සිදුකරන ලද සංශෝධනවලට යටත්ව කටයුතු කරනු ඇත.

3.4 මුදල් හා මුදල්වලට සමාන දෑ

අත ඇති මුදල්, මාර්ගස්ථ මුදල් සහ බැංකුවේ ඇති මුදල්, මුදල් හා මුදල්වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.
අරමුදල් ප්‍රධාන ප්‍රකාශනයේදී බැංකු අයිරාව සහ බැංකු ශේෂයට වැඩියෙන් ලබාගත් මුදල් ද මුදල් හා මුදල් වලට සමාන දෑ ලෙස සලකනු ලැබේ.

මුදල් හා මුදල්වලට සමාන දෑ කෙටි කාලීන මුදල් අවශ්‍යතා සහ අනෙකුත් ගනුදෙනු සඳහා අධික ද්‍රවශීලතාවයක් ඇති ලෙස සැලකේ.

4. මූල්‍ය උපාංග - මූලික හඳුනාගැනීම් හා ඉදිරි පියවර

4.1 මූල්‍ය වත්කම්

4.1.1 වෙළඳ ණය ගැතියෝ

වෙළඳ ණය ගැතියන් සාධාරණ අගයට මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම්කර ඇත.

4.2 මූල්‍ය බැඳුම්කර

4.2.1 දේපළ උකස් කිරීම

සංස්ථාවේ සියළු බැංකු පහසුකම් එනම් බැංකු අයිරාව, කෙටිකාලීන ණය, දිගුකාලීන ණය, ණයවර ලිපි හා කාර්ය සාධන බැංකු ඇපකර ලබාගැනීම සඳහා මහජන බැංකුව වෙත අංක MB 979/3063/3243/1147/422/5789 මගින් සංස්ථාවේ දේපල පිරියත හා උපකරණ උකස් කර ඇත.

මීට අමතරව රාජ්‍ය භාණ්ඩාගාර ඇපකරයක් මගින් 2018/09/07 දින අංක TO/REV/TG/522 යටතේ ද පහත ව්‍යාපෘති සඳහන් කරමින් මහජන බැංකු ණය පහසුකම් ලබාගෙන ඇත.

ව්‍යාපෘතියේ නම	සුරක්ෂිත මුදල (රු.)	කල් ඉකුත්වන දිනය
බැංකු අයිරා, ණයවර ලිපි හා බැඳුම්කර පහසුකම් සඳහා	මිලියන 1,165	2021. 09. 05
අළුත්වැඩියා සහ ක්‍රියාකාරකම් වර්ධනයට මූල්‍ය වෙන්කිරීම සඳහා	මිලියන 185	2023. 09. 15

4.2.2 අසම්භාව්‍ය බැරකම් හා ප්‍රාග්ධන බැඳීම්

(අ) සියළු ප්‍රමාණාත්මක ප්‍රාග්ධන බැඳීම් හා අසම්භාව්‍ය බැරකම් සලකා බලා ඇති අතර මෙම මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපුම් හා අනාවරණයක් සිදු කර ඇත.

(ආ) ලිපිගොනු අංක FR248/1 යටතේ සංස්ථාවේ හිටපු අලෙවි කළමණාකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කළ මූලික අයිතිවාසිකම් නඩුවක් විභාග වෙමින් පවතී.

සංස්ථාව විසින් මුද්‍රණය කරනු ලබන පාසැල් පෙල පොත්, දහම් පාසල් පොත් හා ලොතරැයි මුද්‍රණය හා බෙදා හැරීම සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව සහ ජාතික ලොතරැයි මණ්ඩලය වෙත කාර්යය සාධන බැංකු ඇපකර හා අත්තිකාරම් ගෙවීම් බැඳුම්කර ඉදිරිපත් කර ඇත.

අසම්භාව්‍ය වගකීම්වල මුලු මුදල රු. 130,695,700 ක් වන අතර 2019. 12. 31 දිනට විවෘත කර ඇති ආනයන ණයවර ලිපි වටිනාකම රු. 67,889,175 ක් වේ.

4.3.1 සංචිත

සංස්ථාවේ ආරම්භක ප්‍රාග්ධනය සඳහා පහත පඳහන් පරිදි ප්‍රාග්ධන සංචිතය, පොදු සංචිතය හා සංවර්ධන සංචිතය ඇතුලත් වන පරිදි රජයේ ඒකාබද්ධ අරමුදලින් දායකත්වය ලබා දී තිබේ.

ප්‍රාග්ධන සංචිත	Rs.	102,490.50
සංවර්ධන සංචිත	Rs.	13,901,142.23
පොදු සංචිත	Rs.	1,000,000.00
	Rs.	**15,003,632.73**

සංස්ථාවේ මුල් ගිණුම් කට්ටලයේ සිට මේ දක්වා මෙම සංචිත මූල්‍ය ප්‍රකාශනවල දිගටම පැවතුන අතර මෙම සංචිත පවත්වාගෙන යාමේ අරමුණ පැහැදිලි නැත.

4.3.2 ප්‍රත්‍යාගණන සංචිතය

මෙම සංචිතයට 2016 වසරේදී මෝටර් රථවාහන නැවත තක්සේරු කිරීමෙන් උපදවන ලද ලාභය හා පහත දැක්වෙන පරිදි දේපළ උපකරණ හා පිරියතවල නැවත ප්‍රත්‍යාගණනය කිරීමෙන් ජනිත වූ ලාභය ද ඇතුලත් වේ.

	2016 (Rs.)	2017/18 (Rs.)
මෝටර් හා වෙනත් වාහන	36,015,363	
දේපළ		377,290,608
ගොඩනැගිලි		158,049,568
පිරියත හා යන්ත්‍රෝපකරණ		246,979,194
කාර්යාලයීය උපකරණ සහ ලීබඩු		(8,785,874)
පරිගණක හා උපාංග		(1,537,152)
	36,015,363	**771,996,344**

5. විශ්‍රාම පාරිතෝෂිත වගකීම්

5.1 විශ්‍රාම පාරිතෝෂිකය

1983 අංක 12 පාරිතෝෂික දීමනා පනතට අනුව පාරිතෝෂික දීමනාව ගෙවීමට සංස්ථාව බැඳී සිටින අතර මෙතෙක් නියමිත දිනවලට එම දීමනාව ගෙවා ඇති අතර 2019. 12. 31 දිනට පාරිතෝෂික වෙන්කිරීමට අදාළ අරමුදලක් සංස්ථාව විසින් පවත්වාගෙන යනු නොලැබේ.

5.2 සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

සේවක අර්ථසාධක අරමුදලේ හා සේවක භාරකාර අරමුදලේ නීතිරීතිවලට අනුව සංස්ථාව (සේවායෝජක) විසින් සේවාදායකයා වෙත අදාළ අරමුදල් සඳහා බැර කිරීමට බැඳී සිටී. සංස්ථාව විසින් 12% ක් සහ 3%ක් සේවාදායකයාගේ දළ වැටුපට අනුව සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා භාරකාර අරමුදලට පිළිවෙළින් දායකත්වයක් ලබාදෙනු ලැබේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනාගැනීම

උපචිත පදනම මත සියලු ආදායම් හඳුනා ගැනේ.

පොලී ආදායම

සංස්ථා සේවකයන්ට ලබා දෙන ණය සඳහා 10% ක පොලියක් අය කරනු ලැබේ.

6.2 වියදම් හඳුනාගැනීම

අයභාර වියදම්

සංස්ථාවේ පැවැත්මට හා දේපළ හා උපකරණ කාර්යක්ෂමව නඩත්තු කිරීමට දරන ලද සියළු වියදම් වර්ෂය තුළ ආදායමින් අයකර ඇත.

ප්‍රාග්ධන වියදම්

සංස්ථාවේ දේපළ හා උපකරණවල ඉපයීමේ ධාරිතාව වර්ධනය කරගැනීම හා ඉදිරියට ගෙනයාම සඳහා, දේපළ අත්පත් කරගැනීම සඳහා දිගු කිරීම හෝ වැඩිදියුණු කිරීම සඳහා දරන ලද සියළු වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ.

6.3 ණයට ගැනුම් පිරිවැය

ණයට ගැනුම් පිරිවැය ඒවා සිදුවූ කාලය තුළ වියදම් ලෙස හඳුනාගැනෙන අතර යන්ත්‍ර හා පිරියත ඒවා ක්‍රියාකාරීත්වයට පත්වන තෙක් දරණ ලද ඊට අදාළ පොලී වියදම ප්‍රාග්ධනගත කර ඇත.

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

		2020 රු.	2019 රු.
07.	**ආදායම්**		
	ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාවෙන් ලද ආදායම	122,003,076	166,442,486
	ප්‍රධාන මුද්‍රණාලයෙන් ලද ආදායම		
	පෙළ පොත්	1,369,812,655	979,237,857
	ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	65,561,401	157,645,499
	ජා.ලෝ.ම. ලොතරැයිපත්	266,593,026	268,941,482
	ප්‍රකාශන	410,186	2,872,246
	වෙනත් අලෙවි කටයුතුවලින් ලද ආදායම	18,709,825	18,675,619
		1,843,090,170	**1,593,815,189**
08.	**විකුණුම් පිරිවැය**		
	ප්‍රධාන මුද්‍රණාලය		
	පරිභෝජනය කළ අමුද්‍රව්‍ය	764,884,230	629,573,639
	සෘජු ශ්‍රමය	220,626,316	189,321,830
	සෘජු කර්මාන්තශාලා වියදම්	51,401,247	43,412,565
	වක්‍ර කර්මාන්තශාලා වියදම්	159,206,936	88,242,585
	අනෙකුත් වියදම් / තොග ගැලපීම්	115,659,495	105,170,522
	ප්‍රමාද ගෙවීම් තත්ත්ව හානි හා දඩ (අ. ප්‍ර. දෙ.)	29,789,127	69,264,953
	ප්‍රමාද ගෙවීම් හා දඩ (ජා.ලෝ.ම.)	11,205,760	8,481,350
	අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු සඳහා වෙන්කිරීම්	5,762,226	9,028,466
		1,358,535,337	**1,142,495,910**
	ලිපිද්‍රව්‍ය කර්මාන්තශාලාව		
	පරිභෝජනය කළ ද්‍රව්‍ය	109,757,992	101,065,522
	සෘජු ශ්‍රමය	33,562,154	30,348,260
	සෘජු කර්මාන්තශාලා වියදම්	3,012,310	2,391,960
	වක්‍ර කර්මාන්තශාලා වියදම්	15,490,986	8,927,598
	අනෙකුත් වියදම් / තොග ගැළපීම්	(43,996,230)	14,819,655
		117,827,212	**157,552,995**
	ප්‍රකාශන අංශයේ පිරිවැය	3,007,535	5,336,363
	අනෙකුත් අලෙවි අංශවල පිරිවැය	14,837,994	14,764,217
	මුළු විකුණුම් පිරිවැය	**1,494,208,078**	**1,320,149,485**
09.	**වෙනත් මෙහෙයුම්වලින් ලද ආදායම**		
	මුද්‍රණාලීය අබලි කොල සහ අනෙකුත් ද්‍රව්‍ය	19,686,846	19,010,602
	ටෙන්ඩර් තැන්පතු සහ ලියාපදිංචි	554,000	1,042,015
	ආපන ශාලාවෙන් ලද ආදායම	-	12,800
		20,240,846	**20,065,417**

	2020 රු.	2019 රු.
10. විකිණීමේ හා බෙදාහැරීම් වියදම්		
ජාතිය ගොඩනැගීමේ බද්ද	2,802,242	15,450,486
ආර්ථික සේවා ගාස්තු	9,215,451	7,969,075
මෝටර් රථවාහන නඩත්තුව	2,812,178	4,746,399
දැන්වීම් සඳහා	261,288	518,688
අලෙවි ප්‍රවර්ධන කටයුතු	1,095,827	800,841
බොල් ණය සඳහා ප්‍රතිපාදන	1,984,063	5,597,804
ගිනි රක්ෂණය - අලෙවිසැල්	112,805	59,752
විකුණුම් කොමිස්	-	60,009
නිමි තොග ප්‍රවාහය	-	4,258
නැවත නොගෙවන ටෙන්ඩර් තැන්පතු	166,427	100,345
කුලී	2,956,016	3,451,975
වරිපනම්	39,369	94,575
ජල ගාස්තු - අලෙවිසැල්	36,207	51,566
විදුලිය - අලෙවිසැල්	103,168	133,656
දුරකථන - අලෙවිසැල්	189,969	-
	21,775,010	**39,039,429**
11. ආයතන හා පරිපාලන වියදම්		
ඉඩම් හා ගොඩනැගිලි නඩත්තු	505,784	466,112
කාර්යාල උපකරණ නඩත්තුව	649,239	541,526
ක්ෂයවීම් - කාර්යාලයීය උපකරණ	1,363,012	1,325,311
- පරිගණක උපාංග	233,676	1,928,133
- යතුරුපැදි	-	64,375
වැටුප් හා වේතන	123,819,539	127,816,664
අතිකාල දීමනා	9,986,770	8,809,290
සේවක අර්ථසාධක අරමුදල	15,250,427	16,067,361
සේවක භාරකාර අරමුදල	3,740,731	4,016,842
දිරි දීමනා	1,801,250	1,949,750
සභාපති වේතනය	960,000	447,229
ක්‍රියාකාරී අධ්‍යක්ෂ වේතනය	-	416,116
අධ්‍යක්ෂ ගාස්තු	356,500	388,450
තැපැල් ගාස්තු	137,708	232,264
දුරකථන	1,195,010	1,227,298
මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය	1,760,971	2,479,384
පුවත්පත් දැන්වීම් හා ප්‍රකාශන	883,424	1,001,025
ප්‍රවාහනය හා යැපුම් දීමනා	734,678	1,210,284
පුවත්පත් හා වාර සඟරා	67,060	116,920
රථවාහන කුලී	14,500	-
විදේශ ගමන් / සේවක පුහුණු	-	-
පොදු කාර්යාලයීය වියදම්	185,542	214,241
විගණන වියදම්	900,000	443,573
විවිධ වියදම්	50,751	95,255
නෛතික හා උපදේශන සේවා	533,162	80,679
චින්දනාත්මක කටයුතු	123,528	132,559
පාරිතෝෂික වියදම්	-	6,545,373
සේවක පුහුණු කිරීම්	137,675	442,120
විගණන හා කළමනාකරණ කමිටු ගාස්තු	48,500	129,000
අන්තර්ජාල / විද්‍යුත් තැපෑල	192,252	184,670
ටෙන්ඩර් මණ්ඩල තාක්ෂණික කමිටු වියදම්	1,088,000	600,000
25% මෝටර් රථවාහන නඩත්තුව	2,812,178	4,746,399

	2020 රු.	2019 රු.
නවාතැන් පහසුකම්	-	-
අධ්‍යක්ෂ මණ්ඩල හමු සඳහා වියදම්	32,713	28,370
සාමාජික ගාස්තු	50,000	42,000
පරිත්‍යාග	7,179	390,973
පරිගණක අලුත්වැඩියා හා නඩත්තු ගාස්තු	345,300	256,500
මුදල් ගෙනයාමේ වියදම්	-	-
මුදල් ආරක්ෂක වියදම්	-	-
සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීමේ ගාස්තු	163,883	94,815
බාහිර මුද්‍රණ වැඩ	45,500	-
	170,176,441	**184,930,860**

12. වෙනත් මෙහෙයුම් වියදම්

සේවක සුභසාධනය	18,935,987	21,171,114
සේවක වෛද්‍ය පහසුකම්	8,158,170	9,430,899
නිවාස ණය පොලී	1,772,844	2,087,229
කාර්ය මණ්ඩලය සඳහා ප්‍රසාද දීමනා	-	22,097,071
විශේෂ දිරි දීමනා	-	15,675,000
කාර්ය මණ්ඩල ප්‍රවාහනය	6,962,117	8,503,040
නිවාඩු සඳහා ගෙවීම්	-	13,210,825
කාර්ය මණ්ඩල සම්මාන	47,250	106,750
	35,876,369	**92,281,928**

13. මූල්‍ය වියදම්

බැංකු ගාස්තු හා බැංකු ඇපකර ගාස්තු	1,827,378	9,877,393
බැංකු අයිරා පොලී	4,993,996	6,142,227
බැංකු ණය පොලී - කෙටි කාලීන	100,764,950	111,597,091
බැංකු ණය පොලී - දිගු කාලීන	12,772,308	21,547,216
	120,358,632	**149,163,926**

14. ආදායම් බදු

වර්ෂය සඳහා ආදායම් බදු වෙන් කිරීම - සටහන 14.1	-	-
	-	-

14.1 ආදායම් බදු ගණනය තක්සේරු වර්ෂය 2020/2021
පදනම - 2020 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වන ගිණුම් වර්ෂය

	රු.
වෙළඳ හෝ ව්‍යාපාරවලින් බදු අයකළ හැකි ලාභය	22,732,116
පොලී ආදායම	-
වෙනත් මූලාශ්‍ර වලින් ලාභය	-
ලිපිද්‍රව්‍ය ආදායම	22,732,116
අඩුකළා : මුළු ලිපිද්‍රව්‍ය ආදායම් වලින් අඩුකිරීම්	
වෙළඳ ව්‍යාපාර වලින් අඩුකළ හැකි අලාභ	(22,732,116)
පොලී, වාරික, බිම් කුලී සහ කර්‍ෂ භාගය ගෙවීම්	-
බදු අයකළහැකි ආදායම	-

15. දේපළ, පිරියත සහ උපකරණ

විස්තරය	ප්‍රත්‍යාගණනය 01. 01. 2019	වර්ෂය තුළ එකතුවීම් හා ප්‍රත්‍යාගණනය	වර්ෂය තුළ ඉවත් කිරීම්	ප්‍රත්‍යාගණන/ පිරිවැය 31. 12. 2019	වර්ෂය තුළ ඉවත් කිරීම්	පිරිවැය/ ප්‍රත්‍යාගණනය 01. 01. 2020	වර්ෂය තුළ එකතුවීම් 2020	2020. 12. 31 දිනට ශේෂය
පිරිවැයට								
ඉඩම්	378,500,000	-	-	378,500,000	-	378,500,000	-	378,500,000
ගොඩනැගිලි	166,600,000	-	-	166,600,000	-	166,600,000	-	166,600,000
* පිරියත හා යන්ත්‍රෝපකරණ	535,357,077	10,609,349	-	545,966,426	-	545,966,426	6,144,748	552,111,174
මෝටර් හා වෙනත් වාහන	55,563,000	-	-	55,563,000	-	55,563,000	-	55,563,000
** කාර්යාලයීය උපකරණ	10,833,834	2,887,365	-	13,721,199.00	-	13,721,199	810,041	14,531,240
පරිගණක හා උපාංග	5,785,210	-	-	5,785,210	-	5,785,210	833,514	6,618,724
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,951	-	-	2,572,951	-	2,572,951	-	2,572,951
එකතුව	**1,155,212,072**	**13,496,714**	**-**	**1,168,708,786**	**-**	**1,168,708,786**	**7,788,303**	**1,176,497,089**
සමුච්චිත ක්ෂය වීම්								
විස්තරය	ප්‍රත්‍යාගණනය 01. 01. 2019	වර්ෂය තුළ ක්ෂයවීම් **2019**	වර්ෂය තුළ ඉවත් කිරීම්	සමුච්චිත ක්ෂයවීම් **31.12.2019**	වර්ෂය තුළ ඉවත් කිරීම්	පිරිවැය / ප්‍රත්‍යාගණනය **01.01.2020**	වර්ෂය තුළ ක්ෂයවීම් **2020**	සමුච්චිත ක්ෂයවීම් **31.12.2020**
ගොඩනැගිලි	8,330,000	4,165,000	-	12,495,000	-	12,495,000	4,165,000	16,660,000
පිරියත හා යන්ත්‍රෝපකරණ	65,128,247	40,156,610	-	105,284,857	-	105,284,857	41,154,235	146,439,092
මෝටර් රථ හා මෝටර් සයිකල්	34,728,875	13,890,750		48,619,625	-	48,619,625	6,943,351	55,562,976
කාර්යාලයීය උපකරණ හා ලී බඩු	1,720,312	1,325,310	-	3,045,622	-	3,045,622	1,363,012	4,408,634
පරිගණක හා උපාංග	3,637,380	1,928,132	-	5,565,512	-	5,565,512	233,676	5,799,188
ඉලෙක්ට්‍රොනික ප්‍රතිස්ථාපන	2,572,950	-	-	2,572,950	-	2,572,950	-	2,572,950
එකතුව		**61,465,802**	**-**	**177,583,565**	**-**	**177,583,565**	**53,859,274**	**231,442,839**
ලියා හල අගය				**991,125,221**				**945,054,250**

* / ** revalued under one category during the year

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වයට අදාළ සටහන්

	2020 රු.	2019 රු.
16. තොගය		
අමුද්‍රව්‍ය	134,155,985	95,086,893
පාරිභෝගික භාණ්ඩ	7,987,214	9,408,053
අමතර කොටස්	44,165,115	36,733,611
ලෝහ භාණ්ඩ / ගොඩනැගිලි ද්‍රව්‍ය	1,188,782	946,267
නිමි තොගය	74,834,655	72,762,017
නොනිමි තොගය	43,774,599	56,729,063
මාර්ගස්ථ තොග (අමතර කොටස්)	-	3,467,774
	306,106,350	**275,133,678**
17. වෙළඳ ලැබිය යුතු ශේෂය		
වෙළඳ ණයගැතියෝ	653,613,934	434,984,532
අඩමාණ ණය සඳහා වෙන් කිරීම්	(35,033,326)	(33,049,263)
අ.ප්‍ර.දෙ. තත්ත්ව හානි/දඩ වෙන්කිරීම්	(5,762,226)	(9,028,466)
වෙනත් ණයගැතියෝ	361,309	361,309
	613,179,690	**393,268,112**
18. වෙනත් ලැබිය යුතු ශේෂය		
සේවක ණය හා අත්තිකාරම් (සටහන 18.1)	6,093,339	8,817,032
තැන්පතු හා ලැබීම් (සටහන 18.2)	9,761,392	10,266,188
විකුණුම් පාලන ගිණුම (සටහන 18.3)	(1,561,835.69)	(4,673,971.09)
බැංකු ණය - තීරු/ආන්තික ගිණුම - මහජන බැංකුව ජාත්‍යන්තර	14,533,440	14,533,440
අයකරවා ගතහැකි බදු (ඉ/ගෙ. යෙදවුම් වැට් බදු)	-	-
	28,826,335	**28,942,689**
18.1 ණය හා අත්තිකාරම්		
ආපදා ණය	3,128,277	5,332,274
උත්සව අත්තිකාරම්	2,072,000	2,204,000
සේවක වැටුප් අත්තිකාරම්	5,000	-
ණය හිමි අත්තිකාරම් ගිණුම	888,062	1,280,758
	6,093,339	**8,817,032**
18.2 තැන්පතු හා ලැබීම්		
තැන්පතු සඳහා ලැබීම්	9,316,005	9,766,198
අමතර වෙනත් ලැබීම්	445,387	499,990
	9,761,392	**10,266,188**
18.3 විකුණුම් පාලන ගිණුම		
විකුණුම් පාලන ගිණුම	**(1,561,836)**	**(4,673,971)**
	(1,561,836)	**(4,673,971)**
19. මුදල් හා මුදල්වලට සමාන දෑ		
බැංකුවේ ඇති මුදල්	35,501,418	30,841,763
මාර්ගස්ථ මුදල්	603,662	530,716
අතැති මුදල්	30,000	86,873
	36,135,080	**31,459,352**

මුදල් ගලා ඒම, මුදල් සහ මුදල් හා සමාන ප්‍රකාශනය සඳහා වන තොරතුරු පහත පරිදි වේ.

	2020 රු.	2019 රු.
බැංකුවේ ඇති මුදල්	35,501,418	30,841,763
මාර්ගස්ථ මුදල්	603,662	530,716
අතැති මුදල්	30,000	86,873
	36,135,080	**31,459,352**
බැංකු අයිරා	(43,911,832)	(19,702,073)
	(7,776,752)	**11,757,279**

20. බැංකු ණය - දිගු කාලීන

2019. 07. 01 දිනට ආරම්භක ශේෂය	136,642,139	174,000,236
වර්ෂය තුළ ණය සඳහා ගෙවීම්	(43,725,084)	(37,358,097)
වර්ෂය අවසානයට ශේෂය	**92,917,055**	**136,642,139**

21. විලම්බිත බදු බැරකම්

වර්ෂය ආරම්භක දිනට	(17,105,398)	(11,566,933)
වර්ෂය තුළදී ගැලපීම්/වෙනස් වීම්	-	(5,538,465)
	17,105,398	
වර්ෂය අවසාන දිනට	**-**	**(17,105,398)**

* විලම්භීත බදු සඳහා වෙන්කිරීමක් මෙම වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ වෙන්කොට නොමැත. සංස්ථාව අඛණ්ඩ වසර 5ක සමුච්චිත අලාභයක් වාර්තාකර ඇති බැවින් ඒ සඳහා වෙන් කිරීමක් අවශ්‍ය නොවන බැවිනි.

දේ. පි. උ. සඳහා වූ බදු වෙනස	- රු. (803,098,357)	
කපා හැරීමට ඇති අලාභය	- රු. 929,879,682	
විලම්භිත ගිණුමේ වරද නිවැරදි කිරීම	- රු. 17,105,398	2017 / 2018 වසර සඳහා

22. වෙළඳ ගෙවිය යුතු ශේෂයන්

වෙළඳ ණය හිමියන්	117,459,149	47,478,490
වෙනත් ණය හිමියන්	1,690,775	1,805,999
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	207,799,230	189,965,706
විකුණුම් අත්තිකාරම්	17,584	16,194
වෙනත් ණය හිමියන් (හර ශේෂය)	1,279,658	1,279,658
	328,246,396	**240,546,047**

23. වෙනත් ගෙවිය යුතු ශේෂයන්

උපචිත වියදම්	36,472,800	69,520,565
තැන්පතු ගෙවීම්	1,884,462	1,805,962
සේවකයන් සඳහා ලබාදෙන පොත් සඳහා වෙන් කිරීම්	1,447,150	-
	39,804,411	**71,326,527**

24. කෙටි කාලීන බැංකු ණය (පොළී සහිත)

2020.01.01 දිනට ආරම්භක ශේෂය	840,717,598	770,860,679
ලබා ගත් ණය මුදල	1,502,920,429	1,094,567,698
ණය ගෙවීම් - වර්ෂය තුළ ගෙවීම්	(1,358,174,578)	(1,024,710,779)
2020.12.31 දිනට අවසාන ශේෂය	**985,463,449**	**840,717,598**

කාරක ගිණුම (ප්‍රධාන මුද්‍රණාලය) 2020. 01. 01. සිට 2020. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2020.12.31 දක්වා රු.	2019.12.31 දක්වා රු.
මුද්‍රණ ආදායම		
පෙළපොත්	1,369,812,655	979,237,857
(-) ප්‍රමාද ගෙවීම්/තත්වහානි හා දඩ (අ.ප්‍ර.දෙ.)	(29,789,127)	(69,264,953)
අ.ප්‍ර.දෙ. ප්‍රමාද ගාස්තු/තත්වහානි සඳහා වෙන්කිරීම්	(5,762,226)	(9,028,466)
ලොතරැයි මුද්‍රණය (ජා.ලොෝ.ම.)	266,593,026	268,941,482
(-) ප්‍රමාද ගෙවීම් (ජා.ලොෝ.ම.)	(11,205,760)	(8,481,350)
ජොබ් වැඩ (වාණිජ මුද්‍රණ කටයුතු)	65,561,401	157,645,499
(1) මුළු ආදායම්	1,655,209,969	1,319,050,069
කර්මාන්තශාලා වියදම් (සෘජු)		
අමු ද්‍රව්‍ය පරිභෝජනය	764,884,230	629,573,639
පාරිභෝගික ද්‍රව්‍ය පරිභෝජනය	13,938,266	16,563,902
අමතර කොටස් පරිභෝජනය	22,789,300	12,654,408
ලෝහ භාණ්ඩ පරිභෝජනය	3,647,747	2,896,051
(2) මුළු පරිභෝජනය	805,259,543	661,688,000
ශ්‍රමය - සෘජු		
වැටුප් හා වේතන	136,348,132	132,397,116
අතිකාල දීමනා	22,924,576	33,571,776
කෑලි ගණනට වැඩ කිරීම්	37,362,743	
සේවක අර්ථසාධක අරමුදල	17,600,448	16,993,501
සේවක භාරකාර අරමුදල	4,235,417	4,313,937
දිරි දීමනා	2,155,000	2,045,500
(3) මුළු සෘජු ශ්‍රමය	220,626,316	189,321,830
(4) විදුලිය	11,025,934	11,298,204
(5) මුළු සෘජු පිරිවැය [2 + 3 + 4]	1,036,911,793	862,308,033
කර්මාන්තශාලා වියදම් (වක්‍ර)		
වැටුප් හා වේතන	28,718,602	25,374,693
අතිකාල දීමනා	9,835,526	4,747,556
සේවක අර්ථසාධක අරමුදල	3,679,978	3,261,553
සේවක භාරකාර අරමුදල	1,156,568	811,608
දිරි දීමනා	420,000	380,750
යන්ත්‍රෝපකරණ හා නඩත්තු	8,778,632	3,661,418
බාහිර මුද්‍රණ වැඩ (ජා.ලොෝ.ම.)	53,371,052	611,415
බාකෝඩින් යන්ත්‍ර නඩත්තු කිරීම	9,324,550	5,240,000
විදුලිය	1,225,104	1,255,356
ගිනි රක්ෂණය	631,264	644,129

සාම්පල හා කඩදාසි පරීක්ෂා කිරීමේ ගාස්තු	40,177	786
යන්ත්‍ර කුලියට ගැනීමේ වියදම්	505,840	118,000
සේවක නිල ඇඳුම්	320,919	-
රථ වාහන නඩත්තු		
අලුත්වැඩියාවන්	1,384,247	1,984,613
ඉන්ධන සහ තෙල්	2,221,598	2,605,471
රක්ෂණය	699,514	569,138
ක්ෂය කිරීම	6,943,351	13,826,375
අඩු කළා :-		
25% ක් ලාභාලාභ ගිණුමේ පරිපාලන වියදම්	(2,812,178)	(4,746,399)
25% ක් විකිණීමේ හා බෙදාහැරීමේ වියදම්	(2,812,178)	(4,746,399)
25% ක් ලිපිද්‍රව්‍ය කම්හලේ කාරක ගිණුම සඳහා	(2,812,178)	(4,746,399)
ක්ෂය කිරීම		
ගොඩනැගිලි	3,757,500	3,757,500
යන්ත්‍රෝපකරණ	34,629,048	33,631,422
(6) මුළු වක්‍ර පිරිවැය	159,206,936	88,242,585
(7) නිෂ්පාදන පිරිවැය [5 + 6]	1,214,341,363	950,550,619
එකතු කළා : ආරම්භක තොගය නොනිමි වැඩ තොගය	47,654,896	69,041,424
ආරම්භක තොගය නිමි භාණ්ඩ තොගය	27,520,231	50,534,694
අඩු කළා : අවසාන තොගය නොනිමි වැඩ තොගය	(15,109,365)	(47,654,896)
අවසාන තොගය නිමි භාණ්ඩ තොගය	(2,553)	(27,520,231)
අඩු කළා: අපගේ මුද්‍රණ කටයුතු වල පිරිවැය	(1,760,971)	(2,479,384)
ලිපිද්‍රව්‍ය කම්හලේ මුද්‍රණ පිරිවැය		
ලිපිද්‍රව්‍ය කම්හලේ කාරක ගිණුමට මාරු කළා	0	(2,022,569)
සංස්ථා ප්‍රකාශනවල පිරිවැය		
එම ආදායම් හා වියදම් ගිණුමට මාරු කළා	(253,960)	(2,084,791)
අබලි තොග	42,295	-
ඉඩදිය නොහැකි යෙදවුම් බද්ද	57,568,922	67,356,274
(8) මුළු නිෂ්පාද පිරිවැය	1,330,000,858	1,055,721,140
(9) දළ කාරක ලාභය [1 - 8]	325,209,111	263,328,929

කාරක ගිණුම (ලිපිද්‍රව්‍ය කර්මාන්ත ශාලාව) 2020. 01. 01. සිට 2020. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2020.12.31 දක්වා රු.	2019.12.31 දක්වා රු.
(1) ලිපිද්‍රව්‍ය විකිණීමෙන් ආදායම	122,003,076	166,442,486
කර්මාන්ත ශාලා වියදම් - සෘජු		
මුළු අමුද්‍රව්‍ය පරිභෝජනය	109,757,992	101,065,522
පාරිභෝගික ද්‍රව්‍ය පරිභෝජනය	620,802	914,569
අමතර කොටස් පරිභෝජනය	1,254,586	313,544
(2) මුළු පරිභෝජනය	111,633,380	102,293,636
ශ්‍රමය - සෘජු :		
සේවක වැටුප් හා වේතන	24,096,879	23,695,092
අතිකාල දීමනා	4,645,854	2,520,082
කෑලි ගණනට වැඩ කිරීම්	536,253	-
සේවක අර්ථසාධක අරමුදල	3,131,534	3,064,123
සේවක භාරකාර අරමුදල	782,884	700,713
දිරි දීමනා	368,750	368,250
(3) මුළු සෘජු ශ්‍රමය	33,562,154	30,348,260
මුළු සෘජු පිරිවැය		
(4) විදුලිය	1,136,922	1,163,847
(5) මුළු සෘජු පිරිවැය [2 + 3 + 4]	146,332,456	133,805,743
කර්මාන්ත ශාලා වියදම් - සෘජු		
වැටුප් හා වේතන	6,179,839	1,471,879
අතිකාල දීමනා	514,437	131,062
සේවක අර්ථසාධක අරමුදල	1,068,358	170,698
සේවක භාරකාර අරමුදල	267,089	46,455
දිරි දීමනා	70,250	17,500
යන්ත්‍රෝපකරණ හා නඩත්තු	332,000	28,000
විදුලිය	126,325	129,316
ක්ෂය කිරීම		
ගොඩනැගිලි	407,500	407,500
යන්ත්‍රෝපකරණ	6,525,188	6,525,188
(6) කර්මාන්ත ශාලා වියදම් වක්‍ර	15,490,986	8,927,598
(7) නිෂ්පාදන පිරිවැය [5 + 6]	161,823,441	142,733,341
එකතු කළා : ආරම්භක තොගය		
නොනිමි වැඩ	9,074,168	10,299,531
නිමි භාණ්ඩ	33,501,798	41,793,457
අඩු කළා : අවසාන තොගය		
නොනිමි වැඩ	(28,665,234)	(9,074,168)
නිමි භාණ්ඩ	(60,751,160)	(33,501,798)
අඩු කළා ; පරි. මුද්‍රණ හා ලිපිද්‍රව්‍ය ගිණුමට මාරු කළා		
ලිපිද්‍රව්‍ය මාරුකළා සේවක සුභසාධන, පරිත්‍යාග හා වෙනත්		(1,422,449)
ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් වටිනාකම මාරුකළා	-	2,022,569
මෝටර් රථ වටිනාකම ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා 25%	2,812,178	4,746,399
තොග ඌනතා	(39,725)	(115,549)
තොග අතිරික්තතා	71,747	71,663
(8) එකතුව නිෂ්පාදන පිරිවැය	117,827,212	157,552,996
(9) දළ කාරක ලාභය [1 - 8]	4,175,864	8,889,489

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

ආදායම් සහ වියදම් ගිණුම (ප්‍රකාශන අංශය) 2020. 01. 01. සිට 2020. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2020.12.31 දක්වා රු.	2019.12.31 දක්වා රු.
ආදායම්	410,186	2,872,247
අඩු කළා : නිෂ්පාදන පිරිවැය :		
ආරම්භක තොගය	4,002,452	5,241,035
එකතු කළා: නිෂ්පාදන පිරිවැය ප්‍රධාන මුද්‍රණාල කාරක ගිණුමෙන් මාරුකළා	253,960	2,084,791
එකතු කළා : තොග ඌනතා	(8,385)	(27,031)
තොග අතිරික්තතා	1,707	32,339
මාරු කළා, සේවක සුභසාධන, පරිත්‍යාග සහ වෙනත්	(8,331)	(23,303)
අඩු කළා : අවසාන තොගය	(3,476,962)	(4,002,452)
නිෂ්පාදන පිරිවැය	764,442	3,305,379
අඩු කළා : ප්‍රකාශන සහ අනෙකුත් ආදායම්		
ප්‍රකාශන උපදේශක ගාස්තු	-	1,248
එකතු කළා : වියදම්		
වැටුප් හා වේතන	1,691,877	1,494,976
අතිකාල දීමනා	104,583	30,020
සේවක අර්ථසාධක අරමුදල	218,798	188,255
සේවක භාරකාර අරමුදල	54,699	47,064
දිරි දීමනා	24,000	22,750
නියෝජනය මත විකුණුම් සඳහා ගෙවීම්	47,927	246,671
කර්‍ම භාග	35,708	-
අමතර වියදම්	65,500	-
මුළු නිෂ්පාදන වියදම්	3,007,535	5,336,363
ආදායමට වැඩි වියදම් අතිරික්තය	(2,597,349)	(2,464,116)

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

වෙළඳ ගිණුම (වෙනත් අලෙවි අංශ) 2020. 01. 01. සිට 2020. 12. 31 දක්වා කාලසීමාව තුළ

	2020.12.31 දක්වා රු.	2019.12.31 දක්වා රු.
ආදායම්	18,709,825	18,675,619
අඩු කළා : විකුණුම් පිරිවැය		
ආරම්භක තොගය	7,737,536	9,648,501
මිලදී ගැනීම්	17,707,765	12,849,717
එකතු කළා : තොග ඌනතා	(10,218)	(34,066)
අතිරික්තතා	6,891	37,600
අඩු කළා : අවසාන තොගය	(10,603,979)	(7,737,536)
විකුණුම් පිරිවැය	14,837,994	14,764,217
දළ ලාභය	3,871,831	3,911,403

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } සිඒඑම්/ඩී/එස්පීසී/01/20/178

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 නොවැම්බර් 12 දින

සභාපති
රාජ්‍ය මුද්‍රණ සංස්ථාව

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1. තත්ත්වාගණනය කළ මතය

රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 හි 51 වන ඡේදය ප්‍රකාරව වත්කමක අවශේෂ අගය (Residual value) සහ එහි ඵලදායී ජීවිත කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කලයුතු අතර, අපේක්ෂා කල අගයන් පෙර ඇස්තමේන්තු අගයන්ගෙන්. වෙනස් වේනම් එම වෙනස්කම් ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනස්කමක් ලෙස ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ප්‍රකාරව ගිණුම්ගත කල යුතු වුවද, මුළුමනින්ම ක්ෂය කර ඇති එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු. 4,186,450 ක් වටිනා පරිගණක උපාංග ඒකක 270 ක ඵලදායී ජීවිතකාලය නැවත සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 2021 ජනවාරි මස 21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණය පරිදි සමාලෝචිත වර්ෂය සඳහා, එම වර්ෂයේ ලාභය මත ගෙවීමට අනුමත කරන ලද එකතුව රු. 48,528,036 ක් වූ ප්‍රසාද දීමනා සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබූ බැවින් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය සඳහා අදාල රු. 12,703,425 ක් වූ පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සිදු කර නොතිබූ බැවින් ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්‍රණ කටයුතු අවසන් නොකර නොනිමී තත්වයේ තිබූ එකතු වටිනාකම රු.24,356,981 ක් වූ ඇණවුම් 16 ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායමක් ලෙස සැලකීම නිසා විකුණුම් හා ණයගැති අගයන් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේදී මිලදී ගෙන භාවිතා කරන ලද රු. 685,422 ක් වටිනා ව්‍යාපාර සම්පත් සැලසුම්කරන (ERP) පද්ධතිය ක්ෂය කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය වියදම රු. 17,840 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) මුද්‍රණ සංස්ථාවේ ලෙජරයේ කේවල ගිණුම් ශේෂ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 14 කින් අය විය යුතු ශේෂය රු. 5,010,272 ක් වුවද එම ආයතන විසින් විගණනයට නහවුරු කරන ලද ශේෂය රු 2,725,010 ක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 රාජ්‍ය මුද්‍රණ සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සංස්ථාවේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම.

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විට දී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාව අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණ කළ යුතුය. කෙසේ වුව ද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම් හැර විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරන විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය පුකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(ii) ඡේදය	පිරිවිතර ස්වභාවයෙන් උත්පාදනය වන බවත්, සමාන මට්ටමකින් තරගකාරී බව ප්‍රවර්ධනයය කළ හැකි බවටත් සහතිකවීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම සිදුකළ යුතු වුව ද පිරිවැය රු. 113,600,114 ක් වූ "ලොම්බාර්ඩ් 30" වර්ගයේ යන්ත්‍රය මිලදී ගැනීමේදී එලෙස පිරිවිතර විශ්ලේෂණයක් සිදුකර නොතිබුණි.
(ඇ) 2020 දෙසැම්බර් 18 දිනැති අංක PED 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වක්‍රලේඛය	ප්‍රසාද දීමනා ගෙවිය යුත්තේ 2019 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන වුවද 2020 වර්ෂයේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන සේවකයින් 565 කට අවස්ථා දෙකක දී ප්‍රසාද දීමනා ලෙස රු. 48,528,036ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර තිබුණි.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් කරුණු

(අ). ලොතරැයි ප්‍රමාදවී මුද්‍රණය කර භාරදීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ජාතික ලොතරැයි මණ්ඩලයට ගෙවන ලද මුදලින් එකතුව රු. 11,205,760 ක් ප්‍රමාද ගාස්තු ලෙස අඩු කර තිබුණ අතර එම වටිනාකම සමාලෝචිත වර්ෂයේ ලොතැරැයි ආදායම වූ රු. 266,593,026 හා සැසඳීමේදී සියයට 04 ක ප්‍රතිශතයක් විය.

(ආ). 2021 පාසල් අධ්‍යයන වර්ෂය සඳහා අවශ්‍ය පාසල් පෙළ පොත් දින 01 සිට දින 49 ත් අතර කාලයක් තුළ ප්‍රමාද වී මුද්‍රණය කර භාරදීම නිසා සමාලෝචිත වර්ෂයේ පෙළපොත් මුද්‍රණ ආදායමින් එකතුව රු. 14,918,809 ක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් ප්‍රමාද ගාස්තු ලෙස අඩු කර තිබුණි.

(ඇ). සංස්ථාවේ ජේෂ්ඨ මට්ටමේ තනතුරු 7 න් තනතුරු 5 ක්ම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පුරප්පාඩුව පැවතුණි. එම පුරප්පාඩු වී තිබූ තනතුරු වලින් තනතුරු 3 ක් දින 12 සිට මාස 26 ක කාලපරිච්ඡේදයක් තුල පුරප්පාඩුව පැවතුණි. එසේම මුද්‍රණ කටයුතු සඳහා ඍජුවම බලපාන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 04 ක්, කනිෂ්ඨ මට්ටමේ කළමණාකරුවන් 11 ක්, සහකාර නිලධාරීන් 14 ක් හා කළමනාකරණ සහකාර (තාක්ෂණික) නිලධාරීන් 86 ක් වශයෙන් නිලධාරීන් 115 කගේ තනතුරු පුරප්පාඩු වී තිබුණි. එම පුරප්පාඩු වූ තනතුරු ප්‍රමාණය එම තනතුරු ඛාණ්ඩයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 44 ක් විය. එසේම ප්‍රාථමික මට්ටමේ නුපුහුණු ගණයේ කාර්යමණ්ඩලයේ 82 ක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතිරික්තව පැවතුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

2020

රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) 2022 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් සත්‍යාපනය කරන අවස්ථාවේදීම වත්කමේ ඵලදායී ජීවිත කාලය තක්සේරු කිරීමට කටයුතු කරන අතර 2023 වර්ෂයේදී සංස්ථාව සතු සියලුම ස්ථාවර වත්කම් නැවත ප්‍රත්‍යාගණනය කිරීමට සැලසුම් කර ඇත.

(ආ) 2021.01.21 දිනැති අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය මත පැමිණීම සහ කාර්ය සාධනය පදනම් කර ගෙන 2021 වර්ෂයේ සේවකයින් අභිප්‍රේරණය කිරීමේ මූලික අරමුණින් දිරි දීමනා/ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානය යොමු වූ අතර එම දීමනා පෙර වර්ෂයේ ලාභ ඉපයීම පදනම් කර ගෙන එළඹෙන ඊළඟ වර්ෂයේ ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි.

එසේම 2019 වර්ෂයේ ලාභ උපයා නොතිබූ බැවින් හා සංස්ථාව තුළ පැවැති ද්‍රවශීලතා ගැටලු හේතුවෙන් 2020 වර්ෂයට අදාළව ප්‍රසාද දීමනා නොගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කළ නමුදු සේවක සංගම් හා සේවකයින්ගෙන් පැමිණි, දැඩි ඉල්ලීම් හා විරෝධතා මත හා 2021 වර්ෂයේ සංස්ථා මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාමේ අරමුණින් 2020 වර්ෂය සඳහා අවසන් ගිණුම් සැකසීමෙන් පසුව ලාභයක් පැවතිය හොත් සේවකයින් දිරි ගැන්වීමේ දීමනාවක් වශයෙන් යම් මුදලක් අදියර දෙකකින් ගෙවීමට යෝජනා විය. (එවන් තීරණයකට හේතුව වූයේ කොවිඩ් 19 වසංගතය හමුවේ සේවකයින් නිෂ්පාදන ක්‍රියාවලියට අඛණ්ඩව යොමු කරවා ගැනීම සඳහා ය.)

එබැවින් 2021 වසරේදී ගෙවනු ලැබූ මෙම සේවක දීමනාව ගණනය සඳහා පාදක කරගනු ලැබුවේ ද 2021 ජනවාරි සේවක වැටුප වේ. මෙයට පෙර වසර වලදී ද සංස්ථාව තුළ ගෙවනු ලැබූ දිරි දීමනා ගිණුම්ගත කරනු ලැබුයේ ද අදාළ ගෙවීම් සිදු කරනු ලැබූ ගිණුම් වර්ෂය තුළදී ය. ඒ අනුව එය 2021 ගිණුම් වර්ෂයේ වියදමක් ලෙස ගිණුම් ගත කොට තිබුණි.

එහෙත් අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය නිසි අයුරින් සන්නිවේදනය නොවීම හා ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් අවසන් ගිණුම් ප්‍රකාශය තුළ සිදු කොට නොමැති වීම යන කරුණු සළකා බලා එය විගණන මතය අනුව සංශෝධනය කොට 2020 වසරට ගැලපුම් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) පෙර වර්ෂ කිහිපයකදීම විගණන වාර්තා මගින් පෙන්වා දුන් පරිදි 2020.12.31 අවසන් වර්ෂය සඳහා (LKAS 19) ට අනුව ගිණුම් ප්‍රමිත අංක 19 ට අනුව පාරිතෝෂිකය (Actuarial Value) ක්‍රමය පදනම් කරගෙන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් අනුමත බාහිර විගණක ආයතනයක් මගින් ලබාගත් මෘදුකාංගයක් භාවිත කර පිළියෙලකර ඇති අතර එම ලේඛනය විගණනයට ඉදිරිපත් කර ඇත. (LKAS 19) ට අනුව (Net benefit Liability) ශුද්ධ අගය ගණනය කර ඇති අතර මෙය 2020 මූල්‍ය ප්‍රකාශනයෙහි (5.1) හෙළිදරව් කර ඇත. සමාලෝචිත වර්ෂය දක්වා වෙන් කර ඇති සංචිත ප්‍රමාණය ප්‍රමාණවත් බැවින් 2020 වර්ෂය සඳහා ලාභයෙන් වෙන් කිරීමක් සිදුකර නැත. මෙය සඳහා වූ අධි වෙන් කිරීමක ගිණුම්ගත කිරීම අතපසු වී තිබූ බැවින් එහි වටිනාකම වූ රු. 250,309.68 මුදල 2020 වසරේ අවසන් ගිණුම් සඳහා ගැලපුම් කරනු ලැබේ.

(ඇ) ගණුදෙනුකරුවන්ගේ ඉල්ලීම පරිදි (ඇතැම් රාජ්‍ය ආයතන සඳහා වෙන් කර ඇති මූල්‍ය ප්‍රතිපාදන එම වසරේම වියදම් කළ යුතුව ඇති බැවින්) මුද්‍රණ කටයුතු අවසන් නොවුවද ඔවුන් සඳහා ඉන්වොයිස්පත් නිකුත් කිරීම සිදු කරනු ලබයි.

2020 වර්ෂයේදී පූර්ණ ලෙස වැඩ අවසන් නොකොට නොනිමි තත්ත්වයෙන් තිබූ රු. 2,070,650.39 ක මුද්‍රණ ඇණවුම් ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම මත රු. 22,214,600.17 2020 වර්ෂයට අදාළව ඉන්වොයිස්පත් නිකුත් කොට 2020 ආදායමට ගලපා ඇත. මෙය මීට පෙර වසරවලදීද සිදු කොට ඇතත් එය නිවැරදි විය යුතුව ඇත. ඒ අනුව 2019 වසරේදී ගනුදෙණු කරුවන්ගේ ඉල්ලීම මත නොනිමි තත්ත්වයේ පැවති 2020 වසරේදී වැඩ අවසන් කළ මුද්‍රණ ඇණවුම් වටිනාකම රු. 892,197.04 කි.

ඒ අනුව 2020 ලාභයට එකතු වී ඇති රු. 19,251,752.74 ක ශුද්ධ බලපෑම නිවැරදි කොට 2021 වසරේ අවසන් ගිණුම් සැකසීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) ව්‍යාපාර සම්පත් සැළසුම්කරණ (ERP) පද්ධතිය සමාලෝචිත ගිණුම් වර්ෂයේදී ආරම්භක සංවර්ධන අදියරේ පැවති අතර (ERP) පද්ධතිය සඳහා ඒ වන විට සමස්ථයක් ලෙස දත්තයන් ඇතුළත් කර නොතිබුණි. (එය පරීක්ෂණ මට්ටමෙන් පැවතුණි.) එය භාවිත මට්ටමට පැමිණි පසු පිරිවැය ගණනය කොට ක්ෂය කිරීම් සිදු කිරීම කරනු ලබයි. මෙම පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා ගිණුම් වර්ෂය අවසාන දිනට අත්තිකාරම් මුදලක් පමණක් ගෙවා තිබුණි. මේ වනවිට භාවිත මට්ටමට පැමිණෙමින් පවතී.

(ඊ) මේ පිළිබඳව අදාළ ආයතනයන් විසින් ඉදිරිපත් කළ ශේෂ සමග ලබාදුනහොත් වැඩිදුර සොයා බලා තොරතුරු ඉදිරිපත් කළ හැකි අතර වෙනත් ආයතනයන් විසින් ලබාදෙන තොරතුරුවල නිවැරදිභාවය පිළිබඳව ද ගැටලු පැවතිය හැක. සෑම ආයතනයක් විසින්ම ශේෂ තහවුරුවක් ඉදිරිපත් කිරීම ඔවුන්ගේ වගකීම වේ.

2.2.1 නීතිරීති/විධානයට යොමුව

(අ) 2019 ඔක්තෝබර් 17 වන දින ප්‍රසම්පාදන කමිටුව අනුමත කරන ලද ඉහත ප්‍රසම්පාදනය සඳහා 2018.08.30 දිනැති තාක්ෂණික වාර්තාව පදනම් කර ගෙන තීරණය කර ඇති අතර, තාක්ෂණික කමිටුව විසින් සැපයුම්කරු ඉදිරිපත් කර තිබූ option 1 හා option 2 පිළිබඳ අවධානය යොමුකොට ඇත. දැනට සංස්ථාව සතුව ඇත්තේ option 2 පෙන්වන යන්ත්‍රයක්වන අතර option 1 මගින් පෙන්වන යන්ත්‍රයෙන් එම යන්ත්‍රයට සූරන ලොතරැයිය (Seratch unit) සවිකළ පසු මිල සඳහන් කර ඇත.

ලොතරැයි මණ්ඩලය විසින් සූරන ලොතරැයිය සංස්ථාව වෙත ලබාදී නොමැති නිසා එම අවස්ථාවේදී මිල වැඩි නිසාත් තාක්ෂණික කමිටුව එය බැහැර කර ඇත. ඉහත ලංසුව සඳහා එක් ලංසුකරුවකු පමණක් ලංසු ඉදිරිපත්කර තිබූ අතර, ලංසු ලේඛණය Section V schedule of requirement කොටසෙහි ලංසුකරුගේ පිළිතුර 'ඔව්' 'නැත' ලෙසට පැහැදිලිව දක්වා ඇති හෙයින් විකල්ප වශයෙන් තරගකාරී වෙනත් ලංසුකරුවන් සමග සංසන්ධනාත්මක විශ්ලේෂණයක් මෙහිදී අවශ්‍ය වී නොමැත. එම නිසා අදාළ වගුවේ තොරතුරු පදනම් කරගෙන නිර්දේශ සඳහා යොමුවී ඇත.

(ඇ) 2020 දෙසැම්බර් 18 දිනැති අංක PED 03/2020 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය

වර්ෂය අවසානයේදී සේවකයින් විසින් වෘත්තීය සමිති මගින් ප්‍රසාද දීමනා සඳහා කරන ලද ඉල්ලීම් හේතුවෙන් සහ නිෂ්පාදන කටයුතු අඛණ්ඩව කරගෙන යාම සඳහා මූලික වශයෙන් සේවකයින් අභිප්‍රේරණය කර නව වසරේ පාසල් පොත් මුද්‍රණය නියමිත දිනට නිම කර ගැනීම සඳහා අවසාන ගිණුම් පිළියෙල කිරීමට පෙර කෙටුම්පතේ අවසාන ගිණුම් පදනම් කර ගනිමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අදියර දෙකකින් සේවකයින් වෙත ප්‍රසාද/දිරි දීමනා ගෙවීමට ඇනුමැතිය ලබාදෙන ලදි.

2.3

(අ) සමස්ථයක් ලෙස 2020 වර්ෂයේ ගෝලීය වසංගතයක් ලෙස කොරෝනා රෝගය ව්‍යාප්ත වීම හේතුවෙන් සැලකිය යුතු කාලයක් ආයතනය වසා තැබීමට හේතු වූ අතර, එමෙන්ම එම වසරේ මැයි, ජුනි, ජූලි යන මාසයන්හි ආයතනය විවෘත කළ පසු අවම සේවක පිරිසක් යොදා ගනිමින් නිෂ්පාදන කටයුතු ආරම්භ කළ අතර, මෙම ලොතරැයිපත් මුද්‍රණය සඳහා ද අවම සේවක සංඛ්‍යාවක් සෞඛ්‍යාරක්ෂිත උපදෙස් මත රාජකාරියට වාර්තා කළ අතර, එමගින් දෛනික ලොතරැයිපත් මුද්‍රණය සැලසුම් කළ අයුරින් ඉටු කර ගැනීමට ගැටලුකාරී තත්ත්වයක් ඇති වීම නිසා මෙසේ ලොතරැයි මුද්‍රණය කර ලොතරැයි මණ්ඩලයට ලබාදීම ප්‍රමාද වීම හේතුකොට ගෙන මෙසේ දඩ මුදලක් අයකර ගෙන ඇත.

(ආ) මෙම කාලයවන විට ගෝලීය වසංගතයක් ලෙස පැතිරී ගිය කොරෝනා රෝගය හේතුවෙන් ආයතන සියල්ලම වසා තැබීමට හේතු වූ හෙයින් මුද්‍රණය සඳහා අවශ්‍යවන ප්‍රධාන අමුද්‍රව්‍ය වන සුදු මුද්‍රණ කඩදාසි ආනයනය කිරීමේ ගැටලුකාරී තත්ත්වයක් පැන නැගුණ අතර, මෙම කඩදාසි ප්‍රධාන වශයෙන් නිෂ්පාදනය කරන චීනය හා ඉන්දියාව වැනි රටවල් සම්පූර්ණ වශයෙන් වසා තැබීමට මීට ප්‍රධාන ලෙස බලපෑ බව දන්වා සිටිමි.

තවද, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව හා අප ආයතනය අතර ගිවිසුමේ සඳහන් ආකාරයට ප්‍රමාද වී සපයන පෙළ පොත් සඳහා 05% ක් නොව 0.5%ක ප්‍රමාද දඩ මුදලක් අය කරන බව සඳහන් කර ඇත.

2021 වර්ෂයේ ප්‍රමාද වූ පෙළ පොත් අතුරින් මුල් ඇණවුමට අදාළ පෙළ පොත් 57න් පෙළ පොත් 17 ක් සඳහා පමණක් දඩ මුදල් අයකර ගෙන ඇති අතර, එහි වටිනාකම රු. 9,879,137.04 ක් වේ. තවද දෙවන ඇණවුමට අදාළ සියලුම පෙළ පොත් නියමිත දිනට සපයා අවසන් කිරීම තුළ කිසිදු පෙළ පොතකට අඩු මුදලක් අයකර ගෙන නොමැත.

තවද, පෙළ පොත් මුද්‍රණය සඳහා ලබාදීමෙන් අනතුරුව පොතෙහි ඇතුළත පිටු මුද්‍රණය කර අවසන් කළද එම පොත්වලට අදාළ බාර්කෝඩ් අංක මුද්‍රණයට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් අප වෙත ලබාදෙන විට දවස් 14 ක ප්‍රමාදයක් සිදු විය. මේ නිසා පෙළ පොත් බැඳීම් අංශයේ නිම කිරීමේදී ගැටලුකාරී තත්ත්වයක් ඇති විය.

එසේම මෙම වසරේ අප විසින් මුද්‍රණය සඳහා යොදා ගන්නා ලද සුදු මුද්‍රණ කඩදාසිවල කිසිදු මුද්‍රණ දෝෂයක් නොතිබූ අතර, නිවැරදි පිරිවිතරයන්ට අනුකූලව කඩදාසි ආනයන කර තිබූ බව දන්වා සිටින අතර පෙළ පොත් වර්ග 20 කට අදාළව ඇස්තමේන්තුගත පිටු ප්‍රමාණයට වඩා අඩුවෙන් (මෙවර පෙළ පොත් මුද්‍රණයේ දී අධ්‍යාපන අමාත්‍යතුමා, අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස්තුමා විසින් පෙළ පොතෙහි අන්තර්ගත කරන ලද පණිවුඩ නොයෙදීම නිසා පිටු ගණන අඩුවී ඇත.) මුද්‍රණය කිරීමේදී පිටු ගණන වෙනස්වීම මත පෙළ පොත්වල ඇස්තමේන්තු වටිනාකම වෙනස් වී ඇත. මෙසේ පිටු අඩුවීම නිසා රුපියල් 5,039,671.92 ක මුදලක් අඩු කර ගෙන ඇත.

එම නිසා 2020 වර්ෂයට අදාළව අප විසින් මුද්‍රණය කර සපයන ලද පෙළ පොත්වලින් දඩ මුදලක් ලෙස රුපියල් 9,879,137.04 ක් අය කර ගෙන ඇති අතර, පිටු අඩුවීම මත රුපියල් 5,039,671.92 ක මුදලක් අඩුකර ගෙන ඇති බවද දන්වා සිටිමි.

(ඇ) 2020 වර්ෂයේදී පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා පුවත්පත්වල පුරප්පාඩු පිළිබඳ පළකර අයදුම්පත් කැඳවීමට කටයුතු කළද පැවති කොවිඩ් වංසගත තත්ත්වය මත බඳවා ගැනීම් සිදු කිරීමට නොහැකි විය. තවද 2021 වර්ෂය තුළද අදාළ බඳවා ගැනීම් කළ අතර රට තුළ පැවති කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ සම්මුඛ පරීක්ෂණ තාවකාලිකව අත්හිටුවීමට සිදුවූ අතර නැවත රට විවෘත කිරීමෙන් අනතුරුව එම කටයුතු කඩිනමින් සිදුකර ගැනීමට සැළසුම් කළද රාජ්‍ය ආයතනවල වියදම් සීමා කිරීමේ චක්‍රලේඛ ප්‍රකාරව දැනට එම කටයුතු තාවකාලිකව නවතා ඇත. නමුත් අත්‍යවශ්‍ය බඳවා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මගින් කැබිනට් අනුමැතියකින් අදාළ පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමා වෙත යොමු කර ඇත. අදාළ අනුමැතිය ලද පසු බඳවා ගැනීම් සිදු කිරීමට නියමිතය.

ANNUAL REPORT 2020

State Printing Corporation